මිල ශිලිමය  *Price* 1*s.*

# සිංහල ව්‍යාකරණය.

——0000——

A

# VERNACULAR SINGHALESE GRAMMAR.

BY THE

REV. CHARLES CARTER.

——0000——

COLOMBO:

PRINTED AT THE WESLEYAN MISSION PRESS.

1862.

# VERNACULAR SINGHALESE GRAMMAR.

# සිංහල ව්‍යාකරණයය.

———00000———

1. ව්‍යාකරණයනම් යම් භාෂාවක් ව්‍යවහාරකරන හරි අඳුම පෙන්වන ශාස්ත්‍රයය.
2. භාෂාවල් වචනවලින් සාදා තිබෙනවාය.
3. වචන අක්ෂරවලින් සාදා තිබෙනවාය.
4 අක්ෂරවල ලකුනුවලට අකුරුයයි කියනවාය.

---

## පලමුවෙනි කොට්ඨාසයය.

### අක්ෂර ගැනාය.

I. සිංහල භාෂාවේ අක්ෂර පෙන්වීමට අකුරු පනස් හතක් තිබෙනවාය.

එනම්:—ප්‍රාණාක්ෂර 14 කුත් ගාත්‍රාක්ෂර 37 කුත් ප්‍රාන ගාත්‍රාක්ෂර 6 කුත්ය.

1. ප්‍රාණාක්ෂර කියනෙනන් හුස්මෙන් පමනක් ශබ්ද කරන්ට පුළුවන් ඒවාටය.
2. ගාත්‍රාක්ෂර කියනෙනන් ප්‍රාණාක්ෂරයකින්නුත් කටේ ගාත්‍රාවකින්නුත් ශබ්දකරන ඒවාටය.
3. ප්‍රාණගාත්‍රාක්ෂර කියනෙනන් නියම ප්‍රාණාක්ෂරය කුත් නියම ගාත්‍රාක්ෂරයකුත් ඇති ඒවාටය.

II. ප්‍රාණාක්ෂර දහහතරනම්.

| කොට | දීර්ඝ | කොට | දීර්ඝ | කොට | දීර්ඝ | කොට | දීර්ඝ |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඉ | ඊ, ඊ | උ | ඌ | එ | ඒ |
| ඓ | | ඔ | ඕ | | ඖ | ඇ | ඈ |

1. ප්‍රාණාක්ෂර වර්ග දෙකකට බෙදා තිබෙනවාය. එනම් කොට, දීර්ඝ යන ඒවාය.
2. "අ" වචනවල මුලට මිස වෙන තැන්වල ලියනෙනන් නැත.
3. අනිත් ප්‍රාණාක්ෂර කියවෙන සෑම තැනම ලියනවාය. එහෙත් වචනවල මුලට මිස වෙන තැන්වල ඉහත

ප්‍රත්‍යාතිබේන් අකුරු ලියනෙන් නැතුව ඒවෙනුවට වෙන ලකුණු ගාත්‍රාක්ෂරවලට සන්ධිකර ලියනවාය.

4. ඒ ලකුණුනම්:—

(a) ඇලපිල්ල ා (ආ). ඒක ගාත්‍රාක්ෂරයට අගින් ලියනවාය. කා වාගේය.

(b) ඉස්පිල්ල ි (ඉ) සහ ී (ඊ) ගාත්‍රාක්ෂරයට ඉහලින් ලියනවාය. කි, කී, මි, මී වාගේය.

(c) පාපිල්ල ු සහ ු (උ) ූ සහ ූ (ඌ) ගාත්‍රාක්ෂරයට පාතින් ලියනවාය. කු, කූ, මු, මූ වාගේය. ු, ූ, යන දෙක ක, ග, ත, භ, ර, ශ යන ගාත්‍රාක්ෂරවලට පමනක් සන්ධිකරනවාය. ු ූ අනිත් ගාත්‍රාක්ෂරවලට සන්ධිකරනවාය.

(d) කොම්බුව ෙ (එ) සහ ේ (ඒ). මේවා ගාත්‍රාක්ෂරයට මුලින්ද දෙවෙනි එක ගාත්‍රාක්ෂරයට සන්ධිකරලාද ලියනවාය. කෙ, කේ වාගේය.

(e) ඇදේ ැ (ඇ) සහ ෑ (ඈ) ගාත්‍රාක්ෂරයට අගින් ලියනවාය. කැ, කෑ, වාගේය.

(f) ගයෙනුකිතත ෟ. ෙ ගාත්‍රාක්ෂරයට මුලින්ද ෟ ඊට අගින්ද තිබෙනවානම් ඖ යන ශබ්දය ගාත්‍රාක්ෂරයට අගින් කියවෙනවාය. කෞ, ගෞ වාගේය.

(g) කොම්බු දෙකක් ගාත්‍රාක්ෂරයට මුලින් තිබෙනවානම් ඓ ඊට අගින් කියවෙනවාය. ෛව වාගේය.

(h) ගාත්‍රාක්ෂරයට මුලින් ෙ සහ ගාත්‍රාක්ෂරයට අගින් ා තිබෙනවානම් ඔ සහ ඕ කියවෙනවාය. කො, කෝ වාගේය.

5. අල් ් ් යනලකුන දෙයාකාරයකින් පාවිච්චිකරනවාය

(a) ඔ, එ, ඉ සහ ො, ෙ, එයින් ඇදලා කියවෙනවාය. ඕ, ඒ, ඊ සහ කෝ, කේ, මෝ, මේ වාගේය.

(b) ගාත්‍රාක්ෂරයට අගින් කියවෙන ඇතුලත් ප්‍රානාක්ෂරය (අ) එයින් නැතිකරනවාය මක, මක්, වාගේය.

පලමුවෙනි (්) පස්සට හැරෙන ඉරක් ඇති අකුරුවලටද අනිත් එක (්) අනිත් ඒවාටද ලියනවාය. ආදිස:—ම් ඕ ක් ඒ.

Digitized by Google

III. ගාත්‍රාක්ෂර තිස්හතනම්:—

| | අල්ප | මාප්‍රාන | අල්ප | මාප්‍රාන | අල්ප | |
|---|---|---|---|---|---|---|
| ක වර්ගයය | ක | ඛ | ග | ඝ | ඞ | නාසිකස්වරවූ අක්ෂරවල්ය |
| ච වර්ගයය | ච | ඡ | ජ | ඣ | ඤ, ඥ | |
| ට වර්ගයය | ට | ඨ | ඩ | ඪ | ණ | |
| ත වර්ගයය | ත | ථ | ද | ධ | න | |
| ප වර්ගයය | ප | ඵ | බ | භ | ම | |
| | ය | ර | ල | ව | ං | |
| | ශ | ෂ | ස | හ | ළ | ඃ |

1 ගාත්‍රාක්ෂර වර්ගවලට බෙදා තිබෙනවාය. ක වර්ගයනාදිය සහ අල්ප, මාප්‍රාන, නාසිකස්වර යන වර්ගවල්ය.

2 ය, ර, න, යන අකුරුවලට සමහරවිට වෙන ලකුණු ලියනවාය.

3 ඒ ලකුණුනම් රේඵේ ර්‍, මාත්‍රන්සෙ ්‍ර, යන්සෙ ්‍ය, සඤ්ඤක ෆ, යන ඒවාය.

4 රේඵේ, වෙන ගාත්‍රාක්ෂරයකට මුලින් ර් කියවෙන පිනිස ඒ ගාත්‍රාක්ෂරය මුදුනේ ලියනවාය. පර්වතය වාගේය.

5 මාත්‍රන්සෙ, ගාත්‍රාක්ෂරයක් අල්වී ඊට අගින් ර කියවෙන පිනිස ඒ ගාත්‍රාක්ෂරයට යටින් සන්ධිකර ලියනවාය. පුත්‍රයා වාගේය.

6 යන්සෙ, ගාත්‍රාක්ෂරයක් අල්වී ඊට අගින් ය කියවෙන පිනිස ඒ ගාත්‍රාක්ෂරයට අගින් ලියනවාය. මඟල්‍ය වාගේය.

7 සඤ්ඤක, කාරනා තුනකට පාවිච්චිකරනවාය.

(a) ඨ, ඪ, ධ යන මාප්‍රානාක්ෂරවලට සඤ්ඤක සන්ධිකලාම ඒ ඒ වර්ගවල අල්පවූ අල් අක්ෂර ඒ ඒ මාප්‍රානාක්ෂරවලට මුලින් කියවෙනවාය. ඨ (ටඨ) ඪ (ඩඪ) ධ (අධ)

(b) ච යන අක්ෂරයට ඒක සන්ධිකලාම "ද්" ඊට මුලින් කියවෙනවාය. ච (දච)

(c) අනිත් ගාත්‍රාක්ෂරවලට ඒක සන්ධිකලාම "න්" ඒවාට මුලින් කොටවී කියවෙනවාය.

IV. ප්‍රානගාත්‍රාක්ෂර හයනම්:—ඍ, ඎ, ඏ, ඐ, ඬ, ඹ.

ඍ, ඎ, යන දෙක මිස අනිත් ඒවා දැන් වඩා ව්‍යවහාරවෙනෙන්නැත. ඬ, ඹ යන දෙකත් එසේමය.

Digitized by Google

# දෙවෙනි කොට්ඨාසය.

## වචන ගැනය.

1 ව්‍යාකරනයේ මේ කොඨාසයෙන් වචනවල නොයෙක් වර්ගවල් සහ ඒවා වෙනස්කරන අඳුම්ද පෙන්වනවාය.

2 වචන වර්ගවල් අටක් තිබෙනවාය.

එනම්:—ද්‍රව්‍ය නොහොත් නාමවචන, ගුනවචන, නාමවෙනු වචන, ක්‍රියාවචන, ක්‍රියාඋපකාර වචන, විභක්තිවචන, සන්ධිවචන, විස්මවචන යන ඒවාය.

## නාමවචන ගැනය.

I. නාමවචන කියනෙන්

තැනැත්තන්ගෙත් සත්වයන්ගෙත් දේවලත් ගුනවලත් සිඩවෙනනාවූ කාරණාවලත් නාමවලටය.

ආද්‍රිස:—යොහන්, අශ්වයා, පුටුව—කොළඹ, යහපත්කම, කල්පනාව-කල්පනාකෙරීම.

II. නාමවචන වර්ග දෙකකට බෙදන්ට පුළුවන.

එනම්:—නියම නාමවචනවලට සහ පොදු නාමවචනවලටත්ය.

1 නියම නාමවචනනම් :—නියම තැනැත්තන්ට නොහොත් නියම දේවලට පමනක් පාවිච්චිකරන්නාවූ නාමවල්ය.

ආද්‍රිස:—හෙන්ද්‍රික්, කොළඹ, ලන්කාව.

2 පොදු නාමවචනනම්:—ඒ ඒ වර්ගවල සියල්ලන්ටම නොහොත් සියල්ලටම පාවිච්චිකරනනාවූ නාමවල්ය.

ආද්‍රිස:—මනුෂ්‍යයා, ගොනා, නුවර, පොත.

III. නාමවචනවලට සංඛ්‍යාවත් ලිඟුවත් විභක්තියත් තිබෙනවාය.

එනම්:—1 ඒක සංඛ්‍යාව සහ බහු සංඛ්‍යාවත්ය.
2 පුම්ලිඟුවත් ස්ත්‍රීලිඟුවත් නපුංසක ලිඟුවත්ය.
3 කත්‍රු, කම්, සපදන්, අවදි, සම්බන්ධ, අලප් යන විභක්ති හයය.

IV. සංඛ්‍යාව ගැනය.

1 ඒකසංඛ්‍යාව යන කීමෙන් එක්කෙනෙක් නොහොත් එකක් බව හැගෙනවාය.

ආද්‍රිස:—මනුෂ්‍යයා, මනුෂ්‍යයෙක්, පොත, පොතක්.

Digitized by Google

2 බහුසංඛ්‍යාවෙන් එක්කෙනෙකුට නොහොත් එකක ට වැඩිබව හැඟෙනවාය.

ආදිස:—මනුෂ්‍යයෝ, පොත්.

3 වචනවල සංඛ්‍යාව නොයෙක් අඬුම්වලින් පෙන්වනවාය.

(a) පුම්ලිංගුව ඇති නියම ඒකවචන වඩාම "ආ" යන අක්ෂරයෙන්ද
පුම්ලිංගුව ඇති අනියම් ඒකවචන......"එක්" යන අක්ෂරවලින්ද
පුම්ලිංගුව ඇති බහු වචන වඩාම...... "ඕ" යන අක්ෂරයෙන්ද කෙලවරවෙනවාය.

(b) ස්ත්‍රීලිංගුව ඇති නියට ඒකවචන වඩාම "ඉ" යන අක්ෂරයෙන්ද
ස්ත්‍රීලිංගුව ඇති අනියම් ඒකවචන "යෙක්" යන අක්ෂරවලින්ද
ස්ත්‍රීලිංගුව ඇති බහුවචන ............"යෝ" යන අක්ෂරයෙන්ද කෙලවරවෙනවාය.

(c) නපුංසක ලිංගුව ඇති නියම ඒකවචන "අ" යන අක්ෂරයෙන්ද
නපුංසකලිංගුවඇති අනියම්ඒකවචන"අක්" යන අක්ෂරවලින්ද කෙලවරවෙනවාය.
නපුංසක ලිංගුව ඇති බහු වචන වඩාම සාද නෙන් ඒකවචනය කොටකෙරීමෙන්ය.

4 මෙසේ කොටකෙරීමට සමහරවිට ගාත්‍රාක්ෂරයක් සම හරවිට ප්‍රාණාක්ෂරයක් අත්ඇරදමනවාය.

(a) "ව" නොහොත් "ය" ඒකවචනයේ කෙලවරට තිබෙනවානම් බහු අඬුම සාදන පිනිස ඒක අත්අරිනවාය.

ආදිස:—පුටුව, පුටු, පෙට්ටිය, පෙට්ටි.

(b) අල් ගාත්‍රාක්ෂයකට අයින් එම වර්ගයේ තව ත් එකක් වචනයේ කෙලවරට තිබෙනවානම් ඒ දෙවෙනි එක අත්ඇර අනිත් එකට ප්‍රාණාක්ෂරයක් සන්ධිකරනවාය.

එනම්:—ඒ ගාත්‍රාක්ෂර දෙකට මුලින් සැහැල්ළු ප්‍රාණාක්ෂරයක් (ඉ, එ, ඇ) තිබෙනවානම් "ඉ" සන්ධිකරනවාය. ආදිස:—ලෙල්ල, ලෙලි. එසේ නැත්නම් "උ" සන්ධිකරනවාය.

ආදිස:—වත්ත, වතු.

(c) "ර" වචනයේ කෙලවරට තිබෙනවානම් එසේම වෙනවාය.

ඇද්‍රිස:—කැකිර, කැකිරී, පැදුර, පැදුරු.

(d) ඉහත (a, b) යන කොඨාසවල කියා තිබෙන ගාත්‍රාක්ෂර මිස බහු අඳුම සාදන පිනිස වෙන ඒවා අත්අරිනෙන් නැත.

(e) ඉහත අන්දම්වල වචන සහ කෙලවරට "ට" "ඩ" ඇති වචනත් ඇර කෙලවරට "අ" ඇති වෙනවචනවල බහු අඳුම සාදනෙන් අන්තිම ගාත්‍රාක්ෂරය අල්කෙරීමෙන්ය.

ආද්‍රිස:—අත, අත්.

(f) කෙලවරට "ට" "ඩ" ඇති ඒවා "වල්" සන්ධිකර සාදනාවාය.

ආද්‍රිස:—කට, කටවල්. ගොඩ, ගොඩවල්.

(g) ඉහත ඒවායින් එක විධියකටවත් එකඟනොවෙන වචන ස්වල්පයකුත් තිබෙනවාය.

5 (a) නෑකමුත් ඨානාන්තරත් මනුෂ්‍යජාතිත් පෙන්වන නොයෙක් වචනවල අනියම් ඒක අඳුම "කෙනෙක්" එක්කාසුකෙරීමෙන්ද—එයාකාර නොයෙක් වචනවල බහු අඳුම "ලා" නොහොත් "වරු" එක්කාසුකෙරීමෙන්ද සාදනාවාය.

(b) ගෑනු සතුන්ට අයිති සමහර නාමවචනවල නියම අඳුම නපුංසක විධියෙන්ද පුම් විධියෙන්ද, ඒවායේ අනියම් ඒක අන්දමත් බහු අන්දමත් පුම් විධියෙන්ද පෙනවනවාය.

(c) කා, තා, නා, ලා, හා—යන තනි අක්ෂරවලින් කෙලවරවෙනනාවූ වචනවල බහු අඳුම ඒ ඒ ගාත්‍රාක්ෂර දෙසැරයක් කියා "උ" සන්ධිකර සාදනාවාය.

(d) "ග" යන අක්ෂරයට මුලින් "උ" තිබෙන තැන්වල ඇර අනිත් තැන්වල සහ "අවා" අගට පැමිනෙන; තැන්වලත් ඒ අන්තිම "ආ"—"උ"—වෙනවාය.

සංඛ්‍යාව ගැන ඉහත කියාතිබෙන කාරණාවලට ආද්‍රිසවල්ය.

| | | නියම ඒකසංඛ්‍යාව. | අනියම් ඒකසංඛ්‍යාව. | බහු සංඛ්‍යාව. |
|---|---|---|---|---|
| 3 | a | සහෝදරයා | සහෝදරයෙක් | සහෝදරයෝ |
| | b | සහෝදරී | සහෝදරියෙක් | සහෝදරියෝ |
| 4 | a | පුටුව | පුටුවක් | පුටු |
| | . | පෙට්ටිය | පෙට්ටියක් | පෙට්ටි |

Digitized by Google

| | නියම ඒකසංඛ්‍යාව. | අනියම් ඒකසංඛ්‍යාව. | බහු සංඛ්‍යාව. |
|---|---|---|---|
| b | පැතත | පෑතතක් | පැති |
| . | පිහාටට | පිහාටටක් | පිහාටු |
| c | පැදුර | පැදුරක් | පැදුරු |
| e | මල | මලක් | මල් |
| f | කට | කටක් | කටවල් |
| . | ගොඩ | ගොඩක් | ගොඩවල් |
| . | පාර | පාරක් | පාරවල් |
| 5 a | අයියා | අයියාකෙනෙක් | අයියාලා [වරු |
| . | නිලමේ | නිලමේකෙනෙක් | නිලමේවරු. නිලම |
| . | | සිංහලකෙනෙක් | [වෝ |
| . | යුදෙව්වා | යුදෙව්වෙක් | යුදෙව්වරු. යුදෙව් |
| b | භාර්‍යාව | භාර්‍යාවෙක් | භාර්‍යාවෝ—වරු |
| . | අම්මා | අම්මාකෙනෙක් | අම්මාලා—අම්මාවරු |
| c | කොකා | කොකෙක් | කොකාකු |
| . | ඇතා | ඇතෙක් | ඇතාතු |
| . | වලහා | වලසෙක් | වලස්සු |
| d | හොරා | හොරෙක් | හොරු |
| . | රදවා | රදවෙක් | රදවු |

## V. ලිඟුව ගැනය.

ලිඟු තුනක් තිබෙනවාය.

පුම්ලිඟුවත් ස්ත්‍රීලිඟුවත් නපුංසකලිඟුවත්ය.

1 පුම්ලිඟුවට පිරිමි බව පෙන්වන වචන අයිතිය.
ආදිස:—මනුෂ්‍යයා, පුත්‍රයා.

2 ස්ත්‍රීලිඟුවට ගෑනු බව පෙන්වන වචන අයිතිය.
ආදිස:—ස්ත්‍රී, දුව.

3 නපුංසකලිඟුවට පිරිමි බවවත් ගෑනු බවවත් නොපෙන්වන වචන අයිතිය.
ආදිස:—පොත.

4 සමහර පනානැති දේවල නාමවල් පුම්ලිඟුවේ අන්දම ඇතුව සාදා තිබෙනවාය.
ආදිස:—සූර්‍යයා.

5 පුම්ලිඟුවත් ස්ත්‍රීලිඟුවත් දෙකම අඩංගුවෙනනාවූ වචනවල ලිඟුවට පොදුලිඟුවයයි කියනවාය.
ආදිස:—මිත්‍රයෝ, ගවයෝ, බැටළුවෝ, මනුෂ්‍යයෝ.

Digitized by Google

VI. විභක්ති ගැනය.

1 කතෘවිභක්තියනම්:—කරනනාවත් විඳිනනාවත් සිටින්නාවත් තිබෙන නොහොත් වෙන්නාවූ එකවත් වෙන වචනයක ආධාරය නැතුව පෙන්වන වචනයේ විභක්තියය.

ආදිස:—මම ලියනවා. උඹ දුක්විඳින්ටත් මරනුලබන්ටත් යෙදෙනවා ඇත. ඔහු ඉනනවාය. පොතක් මෙහි තිබෙනවාය. පවතින දේ හොඳය.

2 කම්විභක්තියනම්:—සපදන්විභක්තිය වෙනොහ් නැතුව කතෘගේ ක්‍රියාව ලබන්නා නොහොත් ලබනඑක පෙන්වන වචනයේ විභක්තියය.

ආදිස:—ඔහු මා මරනවාය මම පෙට්ටියක් සාදනවාය.

ඇරත්—විසින්, ලවා, නිසා, පිනිස යනාදී වචනවල බලය ලබනනාවූ, නොහොත් ඒ වචනවලට අයිතිවූ, ඒවාට මුලින් පැමිනෙනනාවූ නාමවචනවල විභක්තිය කම්විභක්තියය.

ආදිස:—මා විසින්, මා කරනකොටගෙන.

3 සපදන් විභක්තියනම් :—යමක් ලැබෙන බවවත් එකඟ වෙන බවවත් පෙන්වනනාවූ, "ට" යන අක්ෂරයෙන් කෙලවරවෙන්නාවූ විභක්තියය.

ආදිස:—මට පොතක් ලැබෙනවා ඔහු ඊට සුදුසුය.

4 අවදි විභක්තියනම් :—යමක් වෙන එකකින් ගනන බවවත් පිටත්වෙනබවවත් ආවුධයක්කොට අ[illegible]විකුරන බවවත් පෙන්වනනාවූ, ගෙන්, එන්, ඉන[illegible]ලවා යින් එකකින් කෙලවරවෙන්නාවූ විභක්තියය.

ආදිස:—මම ඒකඔහුගෙන් ගන්නාය. වතුර උල්පතින් නික්මෙනවාය. මම කඩුවකින් පහරදෙනවාය.

5 සබන්ධ විභක්තියනම් :—වෙන වචනයක ආධාරය නැතුව එකක් වෙන එකකට අයිති බවවත් එකක් වෙන එකක් ඇතුලේ තිබෙන බවවත් පෙන්වනනාවූ, ගේ, ඒ, වල යන ඒවායෙන් එකකින් කෙලවරවෙන්නාවූ විභක්තියය.

ආදිය:—මේක මගේ පොතය. මූ අපේ පියාගේ අශ්වයාය. මේකේ පාට කළුය. මේ ගස්වල කොල හොඳය. ඒක පෙට්ටියේ තිබෙනවාය. ඔහු වත්තේ ඉනනවාය.

6 අලප්විභක්තියනාම්:—අඬගැසීමේ නොහොත් යම් කෙනෙකුට කථාකරනබව පෙන්වන විභක්තියය. ඒක සාදන පිනිස සමහරවිට වචනයේ අන්තිම ප්‍රානාක්ෂරය කොටකර සමහරවිට "නි" "නානි" "එනි" යන ඒවායෙන් එකක් සන්ධිකර සාදනවාය.

ආදිස:—මිත්‍රය, මිත්‍රයානනි, මිත්‍රයෙනි, මිත්‍රවරුනි.

Digitized by Google

## නාමවචනාවල විභක්තිවල්ය

### පුංලිංගුව

| | නියම. | අනියම්. | බහු |
|---|---|---|---|
| කතෘ | මිත්‍රයා | මිත්‍රයෙක් | මිත්‍රයෝ |
| කම් | මිත්‍රයා(ව) | මිත්‍රයෙක් | මිත්‍රයන් |
| සපදන් | මිත්‍රයාට | මිත්‍රයෙකුට | මිත්‍රයන්ට |
| අවදි | මිත්‍රයාගෙන් | මිත්‍රයෙකුගෙන් | මිත්‍රයන්ගෙන් |
| සබඬ | මිත්‍රයාගේ | මිත්‍රයෙකුගේ | මිත්‍රයන්ගේ |
| අලප් | මිත්‍රය | | මිත්‍රයෙනි, මිත්‍රවරුනි |

### ස්ත්‍රී ලිංගුව.

| | | | |
|---|---|---|---|
| කතෘ | ස්ත්‍රී | ස්ත්‍රියෙක් | ස්ත්‍රියෝ |
| කම් | ස්ත්‍රී(ව) | ස්ත්‍රියෙක් | ස්ත්‍රියන් |
| සපදන් | ස්ත්‍රීට | ස්ත්‍රියෙකුට | ස්ත්‍රීන්ට |
| අවදි | ස්ත්‍රීගෙන් | ස්ත්‍රියෙකුගෙන් | ස්ත්‍රීන්ගෙන් |
| සබඬ | ස්ත්‍රීගේ | ස්ත්‍රියෙකුගේ | ස්ත්‍රීන්ගේ |
| අලප් | ස්ත්‍රිය | | ස්ත්‍රිවරුනි |

### නපුංසකලිංගුව.

| | | | |
|---|---|---|---|
| කතෘ | පොත | පොතක් | පොත් |
| කම් | පොත | පොතක් | පොත් |
| සපදන් | පොතට | පොතකට | පොත්වලට |
| අවදි | පොතෙන් | පොතකින් | පොත්වලින් |
| සබඬ | පොතේ | පොතක | පොත්වල |

## ගුණවචන ගැනය.

I. ගුණවචන කියනෙත් නාමවචනාවල ගුණ පෙන්වන වචනාවලට පමනාක්ය.

ආදිස :—හොඳ, නරක, ලොකු, කුඩා, කළු, කාලකන්නි, කරුනාවන්ත.

II. ගුණවචනාවලට සංඛ්‍යාවචත් ලිංගුවචත් විභක්තිවත් නැත.

ආදිස :—හොඳ පුංශියා, හොඳ ස්ත්‍රී, හොඳ පොත.

1 ගුණවචන නාමවචන කොට පාවිච්චිකරනවානම් ඒ තුනාම ඒවාට තිබෙන්ට පුළුවන.

ආදිස :—කරුනාවන්තියෙක්, කරුනාවන්තයෙක්, ධම්මිෂ්ඨයෝ, ධම්මිෂ්ඨයන්ට.

2 ගුණවචන ක්‍රියාඋපකාරවචන කොට පාවිච්චිකරනවානම් විභක්තිවලින් පමනාක් ඒවා කියන්ට පුළුවන.

ඇදිස :—හොඳට, හොඳින්.



Digitized by Google

III. ගුනවචන ක්‍රියාවචනයකට සම්බන්ධවෙලා නැත්නම් ඒවා නාමවචනයට මුලින් පැමිනෙනවාය.

ඇද්‍රිස—මේ මනුෂ්‍යයා යහපත්ව සිටිනවාය. මේක හොඳය නොහොත් හොඳව තිබෙනවාය. යහපත් මනුෂ්‍යයා, හොඳ පොත, පුංචි ලමයා.

IV. ගුනවල තරම පෙන්වන අන්දමත් සිංහල ගුනවචනාවලටම නැතිනමුත් වඩා, වැඩියෙන්, ඉතා යන වචනාවලිනුත් අඩු එක සපදන්විභක්තියෙන් කිමෙනුත් තරම පෙන්වනවාය.

ඇද්‍රිස :—යහපත් මනුෂ්‍යයා, වඩා යහපත් මනුෂ්‍යයා, ඉතා යහපත් මනුෂ්‍යයා, මේක ඊට වඩා ලොකුයි, මේක ඊට ලොකුයි.

V. ගුනවචන දෙවර්ගයක් තිබෙනවාය.

එනම්:—ගුනපෙන්වන නාමවල් සහ නාමවචනාවලින් සාදන ගුනවචනත්ය.

1 ගුනපෙන්වන නාමවල්නම්:—හොඳ, නරක, පුංචි, සවි, ලොකු යනාදි ඒවාය.

2 ගුනවචන නාමවචනාවලින් සෑදීමට අන්දම් කීපයක් තිබෙනවාය.

(a) සමහර නාමවචන වෙනස්නොකර ගුනවචන කොට පාවිච්චිකරනවාය.

ඇද්‍රිස :—යකඩ පිහියේ, රත්තරන් මුදුව, ලී පෙට්ටිය.

(b) වෙන ඒවායෙන් අන්තිම ඇතුලත් ප්‍රානාක්ෂරය වත් අන්තිම "ය" වත් "ව" වත් අත්ඇර ගුනවචන කොට පාවිච්චිකරනවාය.

ඇද්‍රිස:—සීතලය—සීතල කාලය, පුටුව—පුටු කකුල්, කඩදාසිය—කඩදාසි ලියුම, ඇතුල—ඇතුල් කොටසය.

(c) වෙන සමහර නාමවචන නොයෙක් නිපාතවලත් ඇති, ඇත්තාවූ යන වචනාවලත් ආධාරයෙන් ගුනවචනකර සාදනවාය. ඒ නිපාතනම්:—යුක්තවූ, ඊක, වන්ත, වත්, ලත්, සහිත, නීය යන ඒවාය.

(d) යුක්තවූ යන වචනයට අයිති නාමවචනය අවදි විභක්තියෙන් කියනවාය.

ඇද්‍රිස :—ප්‍රඥාවෙන් යුක්තවූ, කරුනාවෙන් යුක්තවූ.

(e) අනිත් නිපාතවලට අයිති නාමවචන ඉහත (b) කොටසයේ පෙන්වා තිබෙන ප්‍රකාරයට ඒ ඒ නිපාතවලට මුලින් සන්ධිකර ගුනවචන සාදනවාය.

ඇද්‍රිස :—ප්‍රඥාඇති, ප්‍රඥාඇත්තාවූ, ප්‍රඥාවන්තවූ, පින්වත්, බලවත්, නම්ලත්, ආසිර්වාදලත්, ලෞකික, සර්වඥයික, ආත්මික, බරසහිත, කරුනාසහිත, ප්‍රසංසනීයවූ, ගෞරවනීයවූ.

Digitized by Google

VI. නිර්ගුණවචන, නොහොත් එක්තරා ගුණයක් නැතිබව පෙන්වන වචන, ගුණවචනවලිනුත් නාමවචනවලිනුත් සාදනවාය.

1 ඒවා ගුණවචනවලින් සාදනොත් නිර්-නු-නෙ-නො-අ-අව-යන නිපාතවලින් එකක් ගුණවචනයට මුලින් සන්ධිකෙරීමෙන්ය.
ආදිස:—නිර්ඝෘණ, නුදුරු, නෙවරදි, නොඇදහිලි, අවංක, අවලක්ෂණ.

2 ඒවා නාමවචනවලින් සාදනොත්—නැති, නැත්තාවූ, රහිත යන නිපාතවලින් එකක් නාමවචනයට අගින් සන්ධිකෙරීමෙන්ය.
ආදිස:—ප්‍රඥානැති, ප්‍රඥානැත්තාවූ, කල්පනාරහිත

---

## නාමවෙනුවචන ගැනය.

---

1 නාමවෙනුවචනනම්:—නාමවචන වෙනුවට පාවිච්චි කරන වචනවල්ය.

2 නාමවෙනුවචන ජාති හතරක් තිබෙනවාය.
ඒවානම්:—(a) තැනන්වූ නාමවෙනුවචනත්
(b) නියම (නොහොත් පෙන්වීමේ) නාම වෙනු වචනත්
(c) අනියම් නාමවෙනුවචනත්
(d) ඇසීමේ නාමවෙනුවචනත්ය.

I. තැනන්වූ නාමවෙනුවචනනම්:—මම, උඹ, ඔහු යනාදි ඒවාය.

1 ඒවාට ස්ථානයත් සංඛ්‍යාවත් විභක්තියත් තිබෙන්ට ඕනැය.

2 දෙවෙනි තුන්වෙනි ස්ථානවලට අයිති ඒවාට ලිංගවත් තිබෙන්ට පුළුවන.

3 නාමවචනවල ලිංගවද සංඛ්‍යාවද විභක්තියද ගැන ඉහල 4, 5 වෙනි පිටවල IV. 1. 2 කොටසවලත් 7, 8 පිටවලත් කියාතිබෙන කාරනා නාමවෙනුවචනවලටත් වැටහෙනවාය.

4 ස්ථාන තුනක් තිබෙනවාය:—ඒවාට, පලමුවෙනි ස්ථානය, දෙවෙනි ස්ථානය, තුන්වෙනි ස්ථානය කියනවාය.
(a) පලමුවෙනි ස්ථානයේ ඒවානම්:—මම, අපි, යන ඒවාය.
(b) දෙවෙනි ස්ථානයේ ඒවානම්:—උඹ, උඹලා, තමුසේ යනාදී ඒවාය.
(c) තුන්වෙනි ස්ථානයේ ඒවානම්:—ඔහු, ඔවුන්, උන්නැහේ යනාදී ඒවාය.
පෙන්වීමේ සහ ඇසීමේ නාමවෙනුවචනත් සියළු නාම වචනත් තුන්වෙනි ස්ථානයට පමණක් අයිතිය.

Digitized by Google

5 තැනාත්වූ නාමවේණුවචන මෙහිපහත පිළිවෙලට කියාතිබෙනවාය.

(a) තැනැත්තන්ට අයිති ඒවා නාම:—

| සථානයය | පලමුවෙනි, | | දෙවෙනි. | | | | තුන්වෙනි. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංඛ්‍යාවය | ඒක. | බහු. | ඒක. | | | බහු. | ඒක. | | බහු. |
| ලිගුවිය | පොදු. | පොදු. | පොදු. | ස්ත්‍රී. | පොදු. | පොදු. | පුං. | ස්ත්‍රී. | පොදු. |
| | මම | අපි | තෝ | තී | | තොපි | එයා. මෙයා | එයා. මෙයා | එයාලා. මෙයාලා |
| | | | | | උඹ | උඹලා | උන්දෑ. මූන්දෑ | උඈ. මූඈ | උඈලා. මූඈලා |
| | | | | | නුඹ | නුඹලා | ඔහු. මොහු | ඈ. මෑ | ඔවුන්. මොවුන් |
| | | | | | තමුසේ | තමුසේලා | උන්නැහේ | | උන්නැහෙලා |
| | | | | | | | මූන්නැහේ | | මූන්නැහෙලා |
| | | | | | තමුන්නාන්සේ | තමුන්නාන්සේලා | උන්නාන්සේ | | උන්නාන්සේලා |
| | | | | | නුඹවහන්සේ | නුඹවහන්සේලා | මූන්නාන්සේ | | මූන්නාන්සේලා |
| | | | | | ඔබ | | උන්වහන්සේ | | උන්වහන්සේලා |
| | | | | | ඔබවහන්සේ | ඔබවහන්සේලා | මූන්වහන්සේ | | මූන්වහන්සේලා |

(b) තිරිසනුන්ට අයිතිඒවානාම්: | ................ | .................. | ඌ. ඒකා | ඒකී | උන්. එවුන්

නපුංසකලිඟුව.

(c) පනනැති දේවලට අයිතිඒවානාම්: ...................................................... ඒක | ඒවා

නාමවෙනුවචනාවල විභක්තිවල්ය.

| විභක්ති. | පලමුවෙනි ස්ථානය. | | දෙවෙනි ස්ථානය. | | | තුන්වෙනි ස්ථානය. | |
|---|---|---|---|---|---|---|---|
| කතෘ | මම | අපි | තෝ | උඹ | උඹලා | ඔහු | ඔවුන් |
| කම් | මා(මාව) | අප(අපව) | තා | උඹ(උඹව) | උඹලා(ව) | ඔහු(ඔහුව) | ඔවුන්(ඔවුනව) |
| සපදන් | මට | අපට | තට | උඹට | උඹලාට | ඔහුට | ඔවුන්ට |
| අවදි | මගෙන් | අපෙන් | තාගෙන් | උඹෙන් | උඹලාගෙන් | ඔහුගෙන් | ඔවුන්ගෙන් |
| සඹඬ | මගේ | අපේ | තාගේ | උඹේ | උඹලාගේ | ඔහුගේ | ඔවුන්ගේ |
| අලප් | | | | | | | |

II. පෙන්විමේ නාමවෙනුවචනනාම්:—අහවල් එකය නොහොත් අහවලායකියා නාමය සඳහන්නොකර පෙන්වන වචනාවල්ය.

1 තැනැත්තන්ට අයිතිඒවානාම්:—

| | ඒක | බහු |
|---|---|---|
| පුං | මෙයා, ඔයා, අරයා, එයා, මොහු, මූනතැගේ යනාදි | මොවුන්, මූනතැහේලා යනාදි |
| ස්ත්‍රී | මෙයා, ඔයා, අරයා, එයා, මෑ යනාදි | මොවුන්, මෑලා |

2 තිරිසනුන්ට අයිතිඒවානාම්:—

| | ඒක | බහු |
|---|---|---|
| පුං | මූ, මෙකා, ඕකා, අරකා, ඒකා | මූන්, මෙවුන්, එවුන් |
| ස්ත්‍රී | මෙකී, ඕකී, අරකී, ඒකී | මූන්, මෙවුන්, එවුන් |

3 දේවලට අයිතිඒවානාම්:—

| | ඒක | බහු |
|---|---|---|
| නපුංසක | මෙක, ඕක, අරක, ඒක | මේවා, ඕවා, අරවා, ඒවා |

4 නාමවචනාවලට මුලින් පැමිණෙන ඒවා නොහොත් පෙන්විමේ ගුනනාමවෙනු වචනාවල්යකියන ඒවානාම්:—

| | මේ. | ඔය. | අර. | ඒ. |
|---|---|---|---|---|
| ඇදිස:— | මේ මනුෂ්‍යයා. | ඔය මනුෂ්‍යයා. | අර මනුෂ්‍යයා. | ඒ මනුෂ්‍යයා. |
| | මේ පොත. | ඔය පොත. | අර පොත. | ඒ පොත. |

Digitized by Google

5 පෙන්වීමේ නාමවෙනුවචන ව්‍යවහාර කරන විධියනම්:—

(a) මේ, මේක, මූ, මොහු, යනාදී ඒවා පලමුවෙනි ස්ථානයට සම්බන්ධවෙනවාය.

ආදිස:—මා ලඟ තිබෙන මේ පොත—මෙහි ඉන්න මොහු—මම කියන මේ දේ.

(b) ඔය, ඕක, ඕකා, යනාදී ඒවා දෙවෙනි ස්ථානයට සම්බන්ධවෙනවාය.

ආදිස:—උඹ ලඟ තිබෙන ඔය පොත—උඹලා කියන ඔය කාරනා.

(c) අර, අරක, අර්කා, යනාදී ඒවා පෙනෙනනාවූ තුන්වෙනි ස්ථානයට සම්බන්ධවෙනවාය.

ආදිස:—අප ඉදිරියේ තිබෙන අර පොත—එනවා අපට පෙනෙනනාවූ අර මනුෂ්‍යයා.

(d) ඒ, ඒක, එයා, යනාදී ඒවා නොපෙනෙනනාවූ තුන්වෙනි ස්ථානයට සම්බන්ධවෙනවාය.

ආදිස:—මම ඊයේ කිව් ඒ කාරනා—උඹ එදා මට පෙන්නූ ඒ පොත—දැන් මෙහි නැති ඒ මනුෂ්‍යයා.

III. අනියම් නාමවෙනුවචනනාම්:—අහවල් එකාය කියා නොකියා ගණනක් නොහොත් ඔක්කොම ගැන පොදුලෙස කථාකෙරීමට පාවිච්චිකරන වචනවල්ය.

තනිඒවා නොහොත් තනියම පාවිච්චිකරනඒවානම්:—

1 සියල්ලෝ, සියල්ල, ඔක්කොම, සේරම.

2 එක එක, එකිනෙකා.

3 කීපයක්, සමහරක්, සමහරු, සමහරෙක්, ස්වල්පයක්

4 (a) යමක්, යමෙක්, කිසිවක්, කිසිවෙක්.

(b) කව්රුවත්, කව්රුනුමුත්, කව්ද(ඇවිත්ඉන්නවා)

(c) මොකවත්, මොකක්වත්, මොකෙක්වත්, මොකක්ද(වෙලාතිබෙනවා), මොනවාවත්, මොකනුමුත්, මොකක්නුමුත්, මොකෙක්නුමුත්, මොකානුමුත්, මොනවානුමුත්.

5 කොහේවත්, කොහේනුමුත්.

6 කවදාවත්, කවදානුමුත්.

7 කොහොමවත්, කොහොමනුමුත්.

8 කොපමනවත්, කොපමනනුමුත්, කොච්චරවත්, කොච්චරනුමුත්, කීයක්වත්, කීයක්නුමුත්.

9 තමතමා, තමතමුන්, එකිනෙකා, ඔවුනොවුන්.

නාමවචන සමග පාවිච්චිකරන ඒවාට අනියම් ගුණනාමවෙනුවචනවල්ය කියනවාය.

ඒවානම්:—සියළු, සෑම, එකඑක, යම්, කිසි, සමහර, මොන, කොයි, කොහොම, කී, කොපමන, කොච්චර.

Digitized by Google

"නුමුත්" යන වචනයේ අභිප්‍රාව ක්‍රියාවචනයේ අඳුමෙන් පෙනවන්ට පුළුවන. නුමුත් ඊට සඹන්ධව තිබුන අනිත් වචනයට එයින් කිසි වෙනසක් අටගනෙන් නැත.

ආදිස:—කොහේනුමුත් ගියාම, කොහේ ගියත්.

IV. ඇසීමේ නාමවෙනුවචනනම්:—ඇසීමෙන් නාමවචනය දැනගනන පිනිස ඒවෙනුවට පාවිච්චිකරන ඒවාය.

1 තනිඒවානම්:—

(a තැනැතතා) කව්ද.

(b දේවල්-සත්තයෝ) මොකද, මොකක්ද, මක්...ද, මොනවාද, මොකාද, මොකෙක්ද.

(c ස්ථානය) කෝ, කොහේද, කොතනද.

(d කාලය) කවදද.

(e තරම-ගනන) කොපමනද, කොච්චරද, කීයද, කීයක්ද.

2 ඉහලකියාතිබෙන සමහර ඒවා විභක්තිවලින් කියන්ට පුළුවන.

මෙසේය (a) කව්ද, කාවද, කාටද, කාගේද, කාගෙන්ද.

(b) මොකද, මොකටද, මොකේද, මොකෙන්ද

(c) කොහේද, කොයනටද, කොහෙන්ද

(d) කවදටද.

(e) කොපමනටද, කොපමනින්ද.

කීයටද, කීයකටද, කීයෙන්ද, කීයකින්ද.

3 නාමවචන සමග පාවිච්චිකරන ඒවානම්:—

කොයි, මොන, කොපමන, කොච්චර.

ආදිස:—කොයි මනුෂ්‍යයාද, මොන දේවල්ද, කොපමන එළු ඕනැද, කොච්චර හාල් ඕනැද.

4 ඇසීම්වලට පමනක් නොව පුදුමවීමටත් කොපමන, කොච්චර, කී යනඒවා පාවිච්චිකරනවාය.

ආදිස:—කොපමන ලක්ෂන නොවේද! කොච්චර හාල් තිබෙනවා නොවේද! අසවයෝ කීදෙනෙක් ඉනනවා නොවේද!

---

## ක්‍රියාවචන ගැනය.

1 ක්‍රියාවචනනම්:—යමක් කරනබවද කරවනබවද, කෙරෙනබවද, වෙනබවද, තිබෙනබවද, යමෙක් සිටිනබවද පෙනවන වචනවල්ය.

2 ක්‍රියාවචන වර්ග දෙකක් තිබෙනවාය.

කැමැතොත් ඒවාය ඉබේ නොහොත් කැමැතත නැති ඒවාය.

(a) කැමැත්තේ ක්‍රියාවචනනම්:—කැමැත්තෙන්ම

Digitized by Google

ක්‍රියා කරනනාවූ නොහොත් කැමැත්තෙන් ක්‍රියා කරනනාක්මෙන් පෙන්වනනාවූ කර්තෘකාරයෙක් ඇති ඒවාය.

ආදිස :—කරනවා, කරවනවා, යනවා, ලබනවා, විදිනවා, තැළිම්කනවා, මරණුලබනවා. මට එල්ලී මැරෙනවා.

ඒවා ජාති තුනකට බෙදන්ට පුළුවන එනම්:—

(i) ක්‍රියාව කර්තෘකාරයාගෙන් නික්ම වෙන යමකට ලැබෙන ඒවාය.

ආදිස :—කරනවා, ලියනවා, මරනවා, ගහනවා.

කරනවාය කියනවානම් යම් දෙයක් කරන බව හැඟෙනවාය. මරනවාය කියනවානම් යම් සතෙක් මරනබව හැඟෙනවාය.

මෙසේ ක්‍රියාව එකකින් නික්ම තවත් එකකට යනබව පෙනෙනවාය.

(ii) ක්‍රියාව කර්තෘකාරයා තුලේම පවතින ඒවාය.

ආදිස:—යනවා, එනවා, නැගිටිනවා, බසිනවා.

එයාකාර ක්‍රියාවල් කර්තෘකාරයා තුලම පවතිනවා මිස වෙන යමකට ලැබෙනෙන් නැත.

(iii) කර්තෘකාරයා විසින්ම කරනෙන් නැතුව වෙන කෙනෙක් විසින් කරන්ට සලස්වනබව පෙන්වන ඒවාය.

ආදිස:—කරවනවා, ලියවනවා, ගෙන්වනවා.

මේවා සාදා තිබෙනෙන් "ව" යන අකුර ක්‍රියාවචනයේ ධාතුවට එකතුකෙරීමෙන් බව පෙනෙනවාය.

එසේ සෑදී තිබෙන සමහර ඒවා ඉහල (i) යන ජාතියට අයිතිය. එසේ වෙන්නේ ඉහල (ii) යන ජාතියේ ඒවායෙන්නුත් ඉබේ ක්‍රියාවචනවලින්නුත් සෑදී තිබෙන නිසාය.

ආදිස:—යවනවා, පමුනුවනවා, පෙන්වනවා, නැගුටුවනවා.

මෙසේ, යමක් යන්ටවත්, පැමිනෙන්ටවත්, පෙනෙන්ටවත් සලස්වනවානම් ඒක යමෙක් ලවා සලස්වන ක්‍රියාවක්නොව තමාගෙන්ම නික්මෙන ක්‍රියාවක් කොට කල්පනාකරනවාය.

(b) ඉබේක්‍රියාවචනනම්:—කර්තෘකාරයාගේ කැමැත්ත නැතුව සිඩවෙන නොහොත් පවතිනබව පෙන්වන ඒවාය.

සමහර ක්‍රියාවචන දෙවර්ගයටම අයිතිය.

ආදිස:—වැටෙනවා, සිඩවෙනවා, ලැබෙනවා, පැමිනෙනවා, බැසෙනවා, එලලෙනවා.

මා සැඩපාරට ගහගනයනවා, මම පැමිනෙනවා, නාගිනවා. ඇත්තේ, ඉනනවා, සිටිනවා, තිබෙනවා.

මේඅන්තිම හතරට පැවැත්මේ ක්‍රියාවචනවල්ය කියනවාය.

Digitized by Google

3 ක්‍රියාවචනවල සමහර අඳුම් පෙන්වන පිනිස ඒ ක්‍රියාවචන එක්ක තවත් සමහර ක්‍රියාවචන පාවිච්චිකරනවාය. එසේ පාවිච්චිකරන ඒවාට උපකාර ක්‍රියාවචනවල්ය කියනවාය.

ඒවා නම්:—තිබෙනවා, ඉන්නවා, සිටිනවා, ඇති, ගන්නවා, දෙනවා, යනවා, එනවා, හදනවා, පුළුවනි, නුපුළුවනි, බෑ, ඕනෑ යන ඒවාය.

ආදිස:—කරතිබෙනවා, කරමින් සිටිනවා, කරගන්නවා, කරන්ට යනවා, වේගනඑනවා, කරන්ට පුළුවනි.

4 ක්‍රියාවල් ගැන අපි නොයෙක් අඳුම්වලින් කල්පනාකර කථාකරනවාය.

ඒනම්:—ක්‍රියාව නිකම් පෙන්වන්ටත් ඒක අනාඥාකරන්ටත් ඒක සිද්ධවෙනවාට කැමතිවෙන්ටත් ඒක අනුමානබවද නොයෙක් කාලවලදී සහ නොයෙක් තැනැත්තන්ගෙනුත් සිද්ධවෙන බවද පෙන්වන්ටත් යෙදෙනවාය.

ඒ වෙනස්වූ කාරනා පෙන්වන පිනිස ක්‍රියාවචනවල අඳුම වෙනස්කරනවාය.

ඒහැටියට ක්‍රියාවචනවලට විධියත් කාලයත් සංඛ්‍යාවත් ස්ථානයත් තිබෙනවාය.

## I. විධිය ගැනය.

1 විධි හයක් තිබෙනවාය

ඒවා නම්:—සත්‍යවිධියය, සන්ධිවිධියය, අනුමානවිධියය, අනාඥාවිධියය, අවසරවිධියය, යාඥාවිධියය.

(a) සත්‍යවිධියනම්:—ක්‍රියාවේ සිද්ධවීම පමනක් කෙළින් පෙන්වන විධියය.

මේ විධියට අඳුම් තුනක් තිබෙනවාය.

එනම්:—(i) කරනවා, කරනවාද, මම කලා, ඔහු කරනවා ඇති, කරතිබෙනවා, කරලා නැත යනාදි ඒවාය.

එසින් ක්‍රියාවම දන්වන නොහොත් කියනබැවින් ඒ අන්දමට—ප්‍රකාශ අඳුමය—කියා කියනනට පුළුවන.

(ii) කරනොත්, කලේ, කරතිබෙනොත්, කලේ නැත යනාදී ඒවාය.

ඒවා ක්‍රියාවම දන්වන පිනිස නොව කාරනා තේරුම්කර දෙන පිනිස පාවිච්චිකරන බැවින් ඒ අඳුමට—විස්ත්‍ර අඳුමය—කියා කියන්නට පුළුවන.

(iii) කරන, කරනනාවූ, කල, කලාවූ, කරතිබෙනනාවූ යනාදි ඒවාය.



Digitized by Google

ඒවා ගුනවචන කොට නාමවචනවලට සඞ්කරන බැවින් ඒ අනුමට—ගුනාඅනුමය—කියා කියන්නට පුළුවන.

(b) සඞ්විධියනම්:—වෙනවෙන කතෘකාරයින්ට අයිති වෙන්ට පුළුවන්වූ, නියම තීන්දුවෙන්නාවූ ක්‍රියාවල් කාලයෙන් සම්බන්ධවී තිබෙනාබව පෙන්වන විධියය.

මේ විධියට අනුම් තුනක් තිබෙනවාය.

(i) කරනකොට යන එකය.

ආදිස:—මම මේක කරනකොට ඔහු ආවා
මම යනකොට ඔහු එනවා.
මම යනකොට ඔහු එනවා ඇති

එයින්, කෙරිමේ වේලාවට තවත් කාරනාවක් සිඬවෙන බව පෙන්වනවාය.

(ii) කරද්දී යනඑකය.

ආදිස:—මම මේක කරද්දී ඔහු වැඩකලා
මම මේක කරද්දී ඔහු වැඩකරනවා ඇති.

එයින්, කෙරිමේ වේලාව අතරතුරේ තවත් කාරනාවක් සිඬවේගනායනබව පෙන්වනවාය.

(iii) කලාම නොහොත් කරපුවාම යන ඒවාය.

ආදිස:—මම මේක කලාම ඔහු ආවා.
මම කථාකරපුවාම ඔහු හිනහවෙනවා.
මම ගියාම ඔහු එනවා ඇති.

එයින්, කෙරිමේවේලාවට පසුව තවත් කාරණාවක් සිඬවෙනබව පෙන්වනවාය.

(c) අනුමාන විධියනම්:—ක්‍රියාවේ සිඬවීම අනුමාන බව පෙන්වන විධියය.

ආදිස:—මම මේක කරනවානම්, කලොත්, කලානම්, කලත්, කරන හුඹුත්.

(d) අනාඥවිධියනම්:—අනාඥකරනබව පෙන්වන විධියය

ආදිස:—තෝ පල, උඹ පලයන්.

උතුම් තැනැත්තාන්ට අනාඥහොකරන බැවින් ඒ කැමැත්ත පෙන්වන්ට වෙන විධිවල් පාවිච්චිකරනවාය.

ආදිස:—තමුසේ එනවා, තමුන්නාන්සේ එන්ඩ, තමුන්නාන්සේ එනවානම් හොඳයි.

(e) අවසරවිධියනම්:—කරන්ට ඉඩදෙනබවද කරනවාට කැමතිබවද පෙන්වන විධියය.

ආදිස:—ඔහු ගියාවේ, ඔවුන් ඒක කරපුවාවේ, කලාවේ, යමු, කරමු, කරමුද.

(f) යාඥවිධියනම්:—යාඥකරනබව පෙන්වන විධියය

ආදිය:—ඔබවහන්සේ අපට කරුනාකල මැනව, වැඩිය මැනව, පැමිනෙව්ව මැනව.

Digitized by Google

ඉහල (d) (e) (f) යන විධි තුනටම පාවිච්චිකරන්ට පුළුවන් ඒවා තිබෙනවාය.

ආදිස:— (d) (e) ඔවුන් ඉගනගනිවා, මේ දේ කරාවා, නිශ්ශබ්දව සිටිවා, මා ලඟට පැමිනේවා.
(f) දෙවියන්වහන්සේ උඹට ආසිර්වාදකරාවා, ඔබට ගෞරවවේවා, උඹට සුභසිද්ධවේවා.

සත්‍යවිධියේ–විස්ත්‍ර, ගුන යන අන්දම්වල හැටියටත් සන්ධි සහ අනුමාන විධිවල හැටියටත් වාසගම සම්පූර්ණකොරීමට තවත් කාරනා ඕනෑකරන නුමුත් කතෘකාරයාගේ ක්‍රියාව එයින්ම තීන්දුවෙන්ට පුළුවන.

ඉන්නිසා ඉහල කියාතිබෙන විධි හය තනියම පාවිච්චිකරන්ට පුළුවන්වූ සම්පූර්ණ විධිවල්ය.
ඒවා ඇර අසම්පූර්ණ විධිවළුත් තිබෙනවාය.

2 අසම්පූර්ණ විධිනම්:—අනන්ත විධිය, සම්පූර්ණ ක්‍රියානිපාතය, අසම්පූර්ණ ක්‍රියානිපාතය යන ඒවාය.

(a) අනන්ත විධියනම්:—කාලයවත් සංඛ්‍යාවවත් ස්ථානයවත් නොපෙන්වනනාවූ, නාමවචනයක් කොට පාවිච්චිකරන්ට පුළුවන්වූ විධියය.

ආදිස:— කරන්ට, කරනනට, කරන්ඩ.
මම මේක කරන්ට(කොරීමට) කැමතියි. ඔහු මේක කරනනට අප්‍රසන්නව සිටියා. ඔහුට ඒක කරන්ඩ පුළුවන්වෙයි. එයාකාර කරන්ඩ හොඳ නැත.

(b) සම්පූර්ණ ක්‍රියානිපාතයනම්:—යම් ක්‍රියාවක් වෙන ක්‍රියාවකට ඉස්සර සම්පූර්ණවෙන බවද සමහර විට ඒ දෙවෙනි ක්‍රියාවේ අන්දමද පෙන්වනනාවූ, ඒ ක්‍රියාවචනයේ කාලයටත් සංඛ්‍යාවටත් ස්ථානයටත් විධියටත් අඩගුවෙනනාවූ අන්දමක්ය.

ඇදිස:- කර, කරලා, ඇවිත්, දී, දීලා, ගිහින්, ගන, වී, ව, වෙලා.
(i) ඔහු කථාකරලා ගියා. පලමුකොට කථාකොරීමද දෙවනුව යාමද එකාකාරයෙන් සිද්ධවූනාය.
(ii) බත්කාලා පලයන්. මේ ක්‍රියාදෙකම අනාඥාකරනවාය.
(iii) පිරිසිදුව වරෙන්. එන්ට ඕනෑබවත් එන්ට ඕනෑ අන්දමත් එයින් පෙන්වනවාය.
අපි ගිහින් ජයගනිමු. ඔවුන් ඇවිත් ජයගනනවාඇති.

Digitized by Google

(c) අසම්පූර්ණ ක්‍රියානිපාතයනම් :—වෙන ක්‍රියාවචනයක කාලයටත් සංඛ්‍යාවටත් ස්ථානයටත් විධියටත් අඩගුවෙනනාවූ, ඒ කාලය අතරතුරේ පළමුවෙනි ක්‍රියාව තීන්දුනැති බව පෙන්වනනාවූ අඳුමත්ය.

ආද්‍රිස:—වැඩකරමින් සිටිනවා. කථාකරකර උනහා. දෙදී (දෙමින්) සිටිනවාඇති. මම යහපත්කම්කරමින් ඇවිදිනවා. උඹ පොත් බෙදදෙමින් ගියා. ඔහු උත්සහකරමින් වැඩකරනවා ඇති. අපි පොත් බලබලා සිටිමු. උඹලා කථාකරකර පලයල්ලා. ඔවුන් වැඩකරමින් සිටියොත්. බෙහෙත් බෙදදෙමින් ගියත්.

ඉහල එක එක ආද්‍රිසයේ ක්‍රියාවචන දෙකම එක කාලයටත් එක තැනැත්තාන්ගෙනුත් එක විධියටත් සිඩවෙන බවද දෙවෙනි ක්‍රියාව සිඩවෙන අතරතුරේදී පළමුවෙනි ක්‍රියාව තීන්දුනැති බවද පෙණෙනවාය.

II. කාලය ගැනය.

1 ක්‍රියාවල්, දැන් තිබෙන කාලයේදීත් පසුවුන කාලයේදීත් මතු පැමිණෙන කාලයේදීත් සිඩවෙන්ට පුළුවන් බැවින් ඒ වෙනස්කම් නොහොත් යම් ක්‍රියාවක් කොයි කාලයට අයිතිද කියා පෙන්වන පිනිස ක්‍රියාවචනයේ අඳුම වෙනස්කරනවාය.

ආද්‍රිස:—කරනවා, කලා, කරනවා ඇති.

(a) ඉහල පළමුවෙනි එකෙන්, දැන් තිබෙන කාලයේදී ක්‍රියාව සිඩවෙනබව පෙන්වනබැවින් ඒකේ කාලයට—වර්තමාන කාලයය—කියනවාය.

(b) දෙවෙනි එකෙන්, පසුවුන කාලයේදී ක්‍රියාව සිඩවුනබව පෙන්වන බැවින් ඒකේ කාලයට—අතීතකාලයය—කියනවාය.

(c) තුන්වෙනි එකෙන්, මතු පැමිණෙන කාලයේදී ක්‍රියාව සිඩවෙන්ට තිබෙනබව පෙන්වනබැවින් ඒකේ කාලයට—අනාගතකාලයය—කියනවාය

2 එම කාලවල් පෙන්වීමට තවත් අඳුම් තුනක් තිබෙනවාය.

ඒනම්:—(a) කරන්ට යෙදෙනවා, කරන්ට යෙදුනා, කරන්ට යෙදෙනවා ඇති.

(b) කරමින් සිටිනවා, කරමින් සිටියා, කරමින් සිටිනවා ඇති.

(c) කරකර සිටිනවා, කරකර සිටියා, කරකර සිටිනවා ඇති.

Digitized by Google

3 කරනවා, කලා, කරනවා ඇති, කරන්ට යෙදෙනවා, කරන්ට යෙදුනා, කරන්ට යෙදෙනවා ඇති යන අඳම්වල ඒවා ඒ ඒ කාලවලට පමනක්නොව පූරුදුටත් පාවිච්චිකරනවාය.

ඇද්‍රිස:—
මොහු සපත්තු මහනවා, මහන්ට යෙදෙනවා [නා
මොහු රක්ෂාවක් පිනිස සපත්තු මැහුවා, මහන්ටයෙදු
මොහු වැඩිවයසට පැමුනුනාම සපත්තු මහනවාඇති,
මහන්ට යෙදේ.

4 කරමින් සිටිනවා යනාදී ඒවායෙන් ක්‍රියාවේ කාලය නොහොත් වේලාව පමනක් හරියටම පෙන්වන්ටත් ඒ අතරතුරේ ක්‍රියාව පවතිනබව පෙන්වන්ටත් යෙදෙනවාය.

ඉහල කියාතිබෙන අඳම්වල කාලවල් වෙන යම් කාලයකට නොහොත් ක්‍රියාවකට ඉස්සරවවත් පසුවවත් පැමිනෙනවාද නැද්ද කියා නොපෙනෙනබැවින් ඒවාට —අසඹන්ධකාලවල්ය— කියනවාය.

5 යම් ක්‍රියාවක කාලය තවත් කාලයකට ඉස්සරව පැමිනෙන බව පෙන්වීමට අඳම් තිබෙනවාය.

(i) ඒවාට—සඹන්ධකාලවල්ය—කියනවාය.

(ii) ඒවා—වර්තමාන, අතීත, අනාගත යන (අඳම් තුනට නොව) කාල තුනටම සඹන්ධවෙනවාය.

(iii) ඒවා සාදනෙන් සම්පූර්ණ ක්‍රියානිපාතය එක්ක පැවැත්මේ ක්‍රියාවචනයක් පාවිච්චිකෙරීමෙන්ය.

ආද්‍රිස:—කර තිබෙනවා, කර තිබුනා, කර තිබේ.

(a) කරතිබෙනවා යන අන්දමෙන් ක්‍රියාව දැන්ම සම්පූර්ණබව පෙනෙනබැවින් ඊට—සම්පූර්ණකාලයය—කියනවාය.

එයින්, පසුවූන යම් කාලයක් ගැන කල්පනාකරනෙන් නැතුව වර්තමානකාලයට ඉස්සර යමක් සිද්ධවූනබව සහ සමහරවිට වර්තමානකාලයේදීත් පවතිනබවද පෙන්වනවාය.

ඇද්‍රිස:—ලියුම ලියාතිබෙනවා, මම එංගලන්තේට ගිහින් තිබෙනවා.

(b) කරතිබුනා යන අඳමෙන්, පසුවූන යම් කාලයකට ඉස්සර ක්‍රියාව සම්පූර්ණවූනබව පෙනෙන බැවින් ඊට—අතීතසම්පූර්ණකාලයය—කියනවාය.

එයින්, අතීතකාලයට ඉස්සර යමක් සිද්ධවූනබව සහ සමහරවිට ඒ කාලයේදීත් පැවතුන බවද පෙන්වනවාය.

Digitized by Google

ඇද්‍රිස:—උඹ එනතට ඉස්සර නොහොත් උඹ එනකොට ලියුම ලියා තිබුනා.

(c) කරතිබේ යන අන්දමෙන්, මතු යම් කාලයකට ඉස්සර ක්‍රියාව සම්පූර්ණවෙන්ට තිබෙන බව පෙනෙන බැවින් ඊට—අනාගත සම්පූර්ණ කාලයය—කියනවාය.

එයින්, අනාගතකාලයට ඉස්සර යමක් සම්පූර්ණවෙනබව සහ සමහරවිට ඒ කාලයේදීත් පවතිනබවද පෙනවනවාය.

ඇද්‍රිස:—එන අවුරුද්දට ඉස්සර ලියුම ලියා තිබේ, ඔහු එනකොට වැඩ සම්පූර්ණකර තිබේ.

## III. සංඛ්‍යාව සහ ස්ථානයත් ගැනය.

ක්‍රියාව කරනෙන්—මම, අපි, උඹ, උඹලා, ඔහු, ඔවුන් යන තැනැත්තන්ගෙන් කා විසින්ද කියා සමහර භාෂාවල ක්‍රියා වචනවල අන්දමෙන්ම හරියටම පෙනෙනවාය. සිංහල භාෂාවෙන් ඒවා එපමන සම්පූර්ණලෙස පෙනෙනෙන් නැත.

1 පලමුවෙනි ස්ථානයේ ඒක අන්දමේ ඒවා නම්:—

කරමි, කලෙමි, කරන්නෙමි, කරනොහොමි යන ඒවාය.

ඒවායින් සංඛ්‍යාවත් ස්ථානයත් දෙකම හරියටම පෙනෙනවාය.

එනම්:—පලමුවෙනි ස්ථානයට අයිති තැනැත්තා වන මම යන එක්කෙනා විසින් කරනබව පෙනෙනවාය.

2 පලමුවෙනි ස්ථානයේ බහු අන්දමේ ඒවා නම්:—

කරමු, කලෙමු, කරනොහොමු යන ඒවාය.

එයින් පලමුවෙනි ස්ථානයට අයිති අපි යන තැනැත්තන් විසින් කරනබව පෙනෙනවාය.

3 දෙවෙනි ස්ථානයේ ඒක අන්දමෙත් බහු අන්දමෙත් ඒවා නම්:—

කරපිය, කරපියව්, කරව, කරව්, කරපන්, කරපල්ලා, කලමැනව යන ඒවාය.

ක්‍රියාවචනයේ මේ අන්දම්වලින්—තෝ, තොපි, උඹ, උඹලා, ඔබ නොහොත් ඔබවහන්සේලා යන දෙවෙනි ස්ථානයේ තැනැත්තන්ට කථාකරනබව පෙනෙනවාය.

4 තුන්වෙනි ස්ථානයේ ඒක සහ බහු අන්දම්වල ඒවා නම්:—

කරපුවාවේ, කලාවේ, කරවා යන ඒවාය.

ඇද්‍රිස:—ඔහු නොහොත් ඔවුන් කරපුවාවේ, කලාවේ, කරවා. ඒක නොහොත් ඒවා සිඩවුනාවේ, සිඩවේවා.

5 ක්‍රියා වචනයේ අනිත් සියළු අන්දම් සංඛ්‍යා දෙකටත් ස්ථාන තුනටත් අයිතිය.

Digitized by Google

ඉන්නිසා ඒවායේ සංඛ්‍යාවත් ස්ථානයත් කියනවානම් ඒවායේ කතෘකාරයාගේ අඳුමේ හැටියට කියන්ට ඕනෑය.

එනම්:—කරනවා, කලා, කරනවා ඇත, කරාවි, කරයි, කරනවානම්, කලොත්, කලත් යන ඒවාට—මම, අපි, උඹ, උඹලා, ඔහු, ඔවුන්, යන අයවළුගෙන් කොයි කෙනෙක් වුනුත් නොහොත් සියල්ලෝම කතෘවෙන්ට පුළුවන.

ආද්‍රිස:—මම කරනවාඇත නොහොත් කරාවිය කියා උඹත් ඔහුත් ඔවුහුත් හිතනවා.

උඹත් මමත් කලාය කියා ඔවුන් හිතුවා.

ඔවුහුත් අපිත් කලොත් උඹලා මක්සිතනවා ඇද්ද?

---

# උපකාර ක්‍රියාවචන ගැනය.

1 ක්‍රියාවල්, නොයෙක් කාලවලදීත් නොයෙක් අඳුම්වලිනුත් සිඩවෙනඒවා කොට මනුෂ්‍යයෝ කල්පනාකරන බැවින් ඒ වෙනස්වූ කාරනා පෙන්වීමට වෙනස්වූ අඳුම් ඕනෑකරනවාය.

සිංහල ක්‍රියාවචනවලටම එපමන වෙනස්වූ අන්දම් නැතිබැවින් ඒ කල්පනාවල් පෙන්වන පිනිස ඉහල කියා තිබෙන හැටියට ක්‍රියාවචන එක්ක තවත් සමහර ක්‍රියා වචන පාවිච්චිකරනවාය.

එසේ පාවිච්චිකරන ඒවාට—උපකාරක්‍රියාවචනවල්ය—කියනවාය.

2 ඒවා පාවිච්චිකරනෙන් කාලයත්, පුළුවන්කමත්, ඕනෑකමත්, අනුමානකමත්, වැඩිවීමත්, අයිතිවීමත්, සිඩවීමත්, විඳීමත් පෙන්වන පිනිසය.

3 කාලය පෙන්වන ඒවානම්:—

තිබෙනවා, සිටිනවා, ඉන්නවා, ඇති, හදනවා, යනවා, එනවා.

ආද්‍රිස:—කර තිබෙනවා, කරන්ට තිබෙනවා, වෙලා සිටිනවා, කරනවා ඇති, කරන්ට ඉන්නවා, කරන්ට හදනවා, කරන්ට යනවා, පිබිදෙන්ට එනවා.

4 පුළුවන්කම පෙන්වන ඒවානම් :—

පුළුවනි, නුපුළුවනි, හැකි, බැරි, තිබුනි.

ආද්‍රිස:—කරන්ට පුළුවනි, කරන්ට නුපුළුවනි, කලහැකි, කරන්ට බැහැ, කරන්ට තිබුණි.

Digitized by Google

5 ඕනෑකම පෙන්වන ඒවානම්:—ඕනෑ, වෙනවා.

ආද්‍රිස:—කරන්ට ඕනෑ, කරන්ට වෙනවා, කරන්ට වුනා, කරන්ට වේ.

6 අනුමානකම පෙන්වන එකනම්:—ඇති.

ආද්‍රිස:—කරන්ට ඇති, කලා ඇති, කරලා ඇති.

7 වැඩිවීම පෙන්වන ඒවා ක්‍රියාවචන දෙකකින් සෑදී තිබෙනවාය.

ඒවානම්:—ගනඑනවා, ගනයනවා.

ආද්‍රිස:—හොඳවේගනඑනවා, නරක්වේගනයනවා, කරගනඑනවා, කරගනයනවා.

8 අයිතිවීමේ ඒවායින් ක්‍රියාවේ ඵල ලැබෙනෙන් කතෘකාරයාටද් නොහොත් වෙනකෙනෙකුටද කියා පෙන්වනවාය

ඒවානම්:—ගන්නවා, දෙනවා,

ආද්‍රිස:—කරගන්නවා, කරදෙනවා, කරගත්තා, කරදුන්නා.

9 සිඩවීමේ එකනම්:—යෙදෙනවා.

එයින් ක්‍රියාවේ සිඩවීම පමනක් පෙන්වනවාය.

ආද්‍රිස:—කරන්ට යෙදෙනවා, කරන්ට යෙදුනා, කරන්ට යෙදේ.

10 විඳිමේ ඒවායින් යමෙකුගේ ක්‍රියාවක් විඳිනබව පෙන්වනවාය.

ඒවානම්:—ලබනවා, කනවා.

ආද්‍රිස:—මරන්නුලබනවා, තැළුම්කනවා.

ඉහල කියාතිබෙන උපකාරක්‍රියාවචනවලින් වැඩිපඟුව ඒවා—ප්‍රධාන ක්‍රියාවචන කොටත්—පාවිච්චිකරනවාය ඒවා උපකාරක්‍රියාවචනවෙනෙන් වෙන ක්‍රියාවචනවලට උපකාරකරන පිනිස ඒවා පාවිච්චිකරන ප්‍රස්ථාවලදී පමනාය.

මෙසේය:—ඒවා මෙහි පහත

| ප්‍රධාන ක්‍රියාවචනවල්ව තිබෙනවාය. | උපකාර ක්‍රියාවචනවල්ව තිබෙනවාය. | |
|---|---|---|
| පොතක් තිබෙනවා. | පොතක් ලියන්ට තිබෙනවා. | තිබෙනවා. |
| පොතක් හදනවා. | පොතක් ලියන්ට හදනවා. | හදනවා. |
| පොතක් ඕනෑ, ඕනෑකරනවා. | පොතක් ලියන්ට ඕනෑ. | ඕනෑ. |
| එහි පොතක් ඇති. | පොතක් ලියන්ට ඇති. | ඇති. |
| පොතක් ගන්නවා. | පොතක් ලියාගන්නවා. | ගන්නවා. |
| සියල්ලනරක්කර(පඤුව)යනවා. | සියල්ල නරක්කරගනයනවා. | ගනයනවා. |
| පොතක් ලබනවා යනාදී. | මරන්නුලබනවා යනාදී. | ලබනවා. |

Digitized by Google

# ක්‍රියාවචනවල ක්‍රමයය.

ඉහල කියාතිබෙන අඥම් මෙහිපහත පිළිවෙලට කියාතිබෙනවාය.

සත්‍ය විධියය.

| | ප්‍රකාශ අඥමය. | විසත්‍ර අඥමය. | ගුන අඥමය. |
| --- | --- | --- | --- |
| වර්තමාන | සාදනවා, සාදමි<br>සාදන්ට යෙදෙනවා<br>සාදමින් සිටිනවා, සාදමින් සිටිමි | සාදනෙන්<br>සාදන්ට යෙදෙනෙන්<br>සාදමින් සිටිනෙන් | සාදන, සාදනනාවූ<br>සාදන්ට යෙදෙන, සාදන්ට යෙදෙන් [නාවූ<br>සාදමින් සිටින, සාදමින් සිටිනනාවූ |
| අතීත | සෑදුවා, සෑදුවෙමි, සෑදුවෙමුව<br>සාදන්ටයෙදුනා, සාදන්ටයෙදුනෙමි<br>සාදමින් සිටියා යනාදී | සෑදුවේ<br>සාදන්ට යෙදුනේ<br>සාදමින් සිටියේ | සෑදූ, සෑදුවාවූ<br>සාදන්ට යෙදුන යනාදී<br>සාදමින් සිටිය යනාදී |
| අනාගත | සාදනවා ඇති, සාදයි, සාදවි<br>සාද[illegible], සාදනෙනම්, සාදනෙනමු<br>සාදන්ට යෙදේ, සාදමින් සිටිනවාඇති යනාදී | | |
| සම්පූර්ණ | සාදාතිබෙනවා, සාදාගන සිටිනවා<br>සාදාගන සිටිමි, සාදාගන ඉනනවා | සාදාතිබෙනෙන්<br>සාදාගන සිටිනෙන් | සාදා තිබෙන යනාදී<br>සාදාගන සිටින, යනාදී |
| අතීත සම්පූර්ණ | සාදාතිබුනා, සාදාගන සිටියා<br>සාදාගනසිටියෙමි, සාදාගන සිටියෙමු | සාදා තිබුනේ<br>සාදාගන සිටියේ | සාදා තිබුන, යනාදී<br>සාදාගන සිටිය, යනාදී |
| අනාගතසම්පූර්ණ | සාදාතිබෙනවා ඇති, සාදාතිබේ<br>සාදාගනසිටිනවා ඇති, යනාදී | | |



Digitized by Google

### සන්ධි විධිය.

සාදනකොට, සාදනකොටම, සාදද්දී, සෑදුවාම, සාදපුවාම.

### අනුමාන විධිය.

| | එකඟ අනුමය. | විරුධ අනුමය |
|---|---|---|
| වර්තමාන | සාදනවානම් | සාදනානුමුත් |
| අතීත | සෑදුවානම් | සෑදුනුමුත් |
| අනාගත | සෑදුවොත්, සාදතොත් | සෑදුවත්, සාදතත් |

### අනාඥා විධිය.

| ඒක අනුමය. | බහු අනුමය |
|---|---|
| සාදව, සාදපිය, සාදපන් (සාදවා) | සාදව්, සාදපියව්, සාදපලලා. |

| | |
|---|---|
| අවසර විධිය | සෑදුවාවේ, සාදපුවාවේ, සාදවා, සාදමු, සාදමුද |
| යාඥා විධිය | සෑදුව මැනව, සාදවා |
| අනන්ත විධිය | සාදන්ට, සාදනනට, සාදන්ඩ |
| සම්පූර්ණ ක්‍රියානිපාතය | සාද, සාදලා |
| අසම්පූර්ණ ක්‍රියානිපාතය | සාදමින්, සාදසාද |

### පුරුදුකරවීමේ පාඩමය.

පුරුදුවීම පිනිස ඉහල ක්‍රමයේ හැටියට තවත් බොහෝ වචනත් එම කාලවලටද විධිවලටද අයිති අනිත් සියළුම අනුමුත් පිලිවෙලට කියන්ට ගෝලයා ඉගනගනීවා.

ඒපිනිස මෙහිපහත පෙනෙන වචන ක්‍රමයේ හැටියට කියාවා.

1 කරනවා, ලියනවා, යනවා, එනවා, මරනවා, දෙනවා.

2 කරවනවා, සාදවනවා, යවනවා, එවනවා, මරවනවා, දණවනවා.

3 කෙරෙනවා, සෑදෙනවා, පැමිනෙනවා, වැටෙනවා, නැගෙනවා.

4 කරන්ට යෙදෙනවා, කරවන්ට යෙදෙනවා, සෑදෙන්ටයෙදෙනවා.

5 කරමින් සිටිනවා, කරකර සිටිනවා.

6 කරගන්නවා, සාදදෙනවා, කරගන සිටිනවා.

7 කරගන යනවා, සාදගන එනවා, සෑදීගන යනවා, සෑදීගන එනවා.

8 වෙනවා, සිටිනවා, ඉන්නවා, තිබෙනවා.

Digitized by Google

ක්‍රියාවචන දෙකක් නොහොත් තුනක් අඩංගුවෙනඒවායින් අන්තිම එක පමනක් වෙනස්කරගනයන්ට ඕනෑය.

මෙසේය:—කරන්ට යෙදෙනවා, කරන්ට යෙදුනා යනාදිය.
කරමින් සිටිනවා, කරමින් සිටියොත් යනාදිය.
සාදගනයනවා, සාදගන පලයන් යනාදිය.
සෑදීගනයන්ට යෙදෙනවා, සෑදීගනයන්ට යෙදුනත් යනාදිය.

---

## ක්‍රියාඋපකාර වචන ගැනාය.

I. ක්‍රියාඋපකාර වචනනාම්:—ක්‍රියාවචනවලත් ගුනවචනවලත් වෙන ක්‍රියාඋපකාරවචනවලත් අභිප්‍රාව නොයෙක් අඳුම්වලින් වෙනස්කරන පිනිස පාවිච්චිකරන ඒවාය.

ආද්‍රිස:—(a) ඔහු හොඳට කථාකරනවාය.

මෙහි හොඳට යනඑකෙන් කථාකෙරීමේ අඳුම පෙනවනවාය.

(b) ඔහු ඉතා හොඳට කථාකරනවාය. මේක ඉතා හොඳ පොතක්ය.

මෙහි ඉතා යනඑකෙන් කථාකෙරීමේත් පොතෙත් හොඳකමේ තරම පෙනවනවාය,

II. ක්‍රියාඋපකාරවචන කොඨාස පහකට බෙදන්ට පුළුවන.

1 කාලය පෙන්වන ඒවානම්:—දැන්, එතකොට, ඉස්සර, ඉස්සරව, ප්‍රථම, පෙර, පලමුවෙන්, ඉක්මනින්, පසු, පසුව, පස්සේ, කඩිනමින්, එවලේම, එකනෙහිම, නිතරම, පලමු කොට, පලමුවෙනුව, දෙවනුව යනාදී, අද, හෙට, ඊයේ, නැවත, නොයෙක්විට යනාදී ඒවාය.

2 ස්ථානය පෙනවන ඒවානම්:—එහි, මෙහි, උඩ, යට, තුල, පිට, පිටත, එහයින්, මෙහයින්, ඉදිරියේ, ඉහල, පහල, ඉස් සරහ, පස්සට, ලඟ, දුර, අහක යනාදී ඒවාය.

3 ගුන පෙනවන ඒවානම්:—මෙයාකාරයට, එයාකාරයෙන්, ඔයාකාර, හොඳට, කරුනාවන්තලෙස, ඉක්මනට, සවියෙන්, බලවත්ලෙස, යනාදී ඒවාය.

4 තරම පෙන්වන ඒවානම්:—පමනක්, මුළුමනිම්ම, ඉතා, යන්තම්. ටිකක්, තව, වඩා, බොහොම යනාදී ඒවාය.

5 විධිය පෙන්වන ඒවානම්:—ඔව්, නැත, සත්තකටම, සැබවින්ම, කොහෙත්ම, බාගවේලාවට, සමහරවිට යනාදී ඒවාය.

ඉහල කියාතිබෙන සමහර ඒවා නොයෙක් කොඨාසවලටත් අභිප්‍රාවලටත් පාවිච්චිකරන්ට පුළුවන.

Digitized by Google

ආදිස :—බහු සමහරවිට (සමහර ප්‍රස්ථාවල) ගියාය.

මෙහි සමහරවිට යන එක 1 කොඨාසයට අයිතිය.

බහු සමහරවිට (බාගවේලාවට) යනවා ඇත.

මෙහි සමහරවිට යන එක 5 කොඨාසයට අයිතිය.

මේක ටිකක් නරකයි.

මෙහි ටිකක් යන එක 4 කොඨාසයට අයිතිය.

ටිකක් ගෙනෙන්.

මෙහි ටිකක් යනඑක නාමවෙනුවචනයක්ව තිබෙනවාය.

III. ක්‍රියාඋපකාරවචන සාදතිබෙන අන්දම් ගැනය.

1 සමහර ඒවා ගුනවචනවලින් සාදනවාය.

(a) ගුනවචන සපදන් විභක්තියෙනුත් අවදිවිභක්තියෙනුත් කීමෙන් සාදනවාය.

ආදිස :—හොඳට, නරකට, ලක්ෂනට, සවියට, පුවියට, හයියෙන්, පහතින්.

(b) ගුනවචනවලට ලෙස යනඑක එකතුකොරීමෙන් සාදනවාය.

ආදිස :—ප්‍රඥාවන්තලෙස, හොඳලෙස, සැක්තිමත්ලෙස.

2 ක්‍රියාඋපකාරවචන කොට පමනක්ම පාවිච්චිකරන ඒවාත් තිබෙනවාය.

ආදිස :—එතකොට, පෙර, පසුව, එකනෙහිම, නිතරම, පමනක්, මුළුමනිම්ම, ඉතා, යනාදී ඒවාය.

3 සමහර ක්‍රියාඋපකාරවචන සපදන් විභක්තියෙනුත් අවදිවිභක්තියෙනුත් කියනවාය.

ආදිස :—පස්සේ, පස්සට, පස්සෙන්, එහි, එහාට, එහෙන්, පහල, පහලින්, පහලට, සවිලෙස, සවිලෙසට, සවිලෙසින්.

---

## විභක්තිවචන ගැනය.

I. විභක්තිවල්ය කියන අන්දම්වලින් නාමවචන වෙනස්කර පාවිච්චිකරනොත් ඒ නාමවචනවලට තවත් වචන (එනම ක්‍රියාවචන, ගුනවචන, ක්‍රියාඋපකාර වචන, තවත් නාමවචන) සන්ධි වෙනහැටි පෙන්වන පිනිසය.

නුමුත් ඒ විභක්ති හයෙන් පෙන්වන්ට බැරි අන්දමුත් තිබෙනවාය. —— ඒ අන්දම් පෙන්වන පිනිස නාමවචනවලට අගින් තවත් වචන සන්ධිකරන්ට ඕනෑකරනවාය.

මෙසේ විභක්ති වෙනුවට පාවිච්චිකරන ඒවාට——විභක්ති වචනවල්ය කියනවාය.

Digitized by Google

II. සමහරවිට අභිප්‍රාව විභක්තියකින් පෙන්වන්ට පුළුවන් නුමුත් විභක්තිය වෙනුවට විභක්තිවචනයක් පාවිච්චි කරනවාය.

මෙසේ, ලියුමක් මට එව්වාය වෙනුවට ලියුමක් මා වෙතට එව්වාය කියනතට පුළුවන. නුමුත්, ඔහු මා වෙතට ආවාය වෙනුවට ඔහු මට ආවාය කියන්ට බැරිය.

ඉහල පලමුවෙනි වාසගමේ අභිප්‍රාවට සුදුසු විභක්තියක් තිබෙද්දිත් ඒවෙනුවට "වෙතට" යන වචනය පාවිච්චිකලාය.

දෙවෙනි වාසගමේ "වෙතට" යන වචනය පාවිච්චිකලේ පෙනවන්ට ඕනෑකරන අභිප්‍රාවට සුදුසු විභක්තියක් නැතිනිසාය.

III. විභක්තිවචනනම්:—සමග, ගැන, විසින්, ලඟ, පිනිස, නිසා, අත, උඩ, යට, තුල, උදෙසා, දෙස, ඉදිරියේ යනාදි ඒවාය.

1 සමහර විභක්තිවචනාවලට විභක්ති සන්ධිකරනවාය.

ආදිස :—පිට, පිටට, පිටින්, වෙත, වෙතට, වෙතින්, තුල, තුලේ, තුලට, තුලෙන්.

2 විභක්තිවචනාවලට අයිතිවූ, ඒවාට මුලින් පැමිනෙන නාමවචන (නොහොත් නාමවෙනුවචන) ඒවාට සන්ධිකරන විභක්තිවචන නිසාම කම්විභක්තියෙන් කියන්ට ඕනෑය.

ආදිස :—(මම නිසා නොව) මා නිසා, අප ඉදිරිපිට, මනුෂ්‍යයන් කෙරෙහි, දූසයන් ලවා.

3 නාමවචනයට කම්විභක්තිය තිබෙද්දී විභක්තිවචනයක්ව තිබුන වචනය නාමවචනයට සපදන් විභක්තිය තිබෙනවිට ක්‍රියාඋපකාර වචනයක් වෙන්ටත් නාමවචනයට සඹන්ධවිභක්තිය තිබෙනවිට නාමවචනයක් වෙන්ටත් යෙදෙනවාය.

ඒ හැටියට—ඉස්සර, උඩ, පස්සේ—යන ඒවා මෙහිපහත විභක්තිවචන වෙනවාය. ක්‍රියාඋපකාරවචන වෙනවාය.

| | |
|---|---|
| ආදිස :—* ඔහු මා ඉස්සරහට ආවා. | ඔහු මට ඉස්සරහයින් ආවා. |
| ඔහු මා උඩින් පැනනා | ඌ මට උඩින් ඉගිළුනා. |
| ඔහු මා පස්සේ ආවා. | ඔහු මට පස්සේ (පසුව) ආවා. |
| ඒක අප උඩ තිබෙනවා. | තාරුකා අපට උඩින් තිබෙනවා |

* As in English—*He came before me*, *He came previously to me*, —where *before* is a preposition and *previously* is an adverb.

Digitized by Google

• අත, පිට යන ඒවා මෙහි පහත

| විභක්ති වචනවෙනවාය. | නාමවචනවෙනවාය. |
|---|---|
| ඒක මා අත ඇරියා. | ඒක මගේ අතේ තිබෙනවා. |
| ඒක මා පිට තිබෙනවා | ඒක මගේ පිටේ තිබෙනවා. |

4 විභක්ති වචනනම්, ක්‍රියාවචනය නාමවචනයට නොහොත් නාමවෙනු වචනයට සම්බන්ධවෙන අන්දම පෙන්වන පිනිස (නාමවචනයේ විභක්ති වෙනුවට) පාවිච්චි කරන ඒවා පමනක් බව ඥාතට ගන්ට ඕනෑය.

මෙසේ, ඔහු මා නිසා ගියාය—ඔහු රක්‍ෂාවක් පිනිස වැඩ කලාය යන වාසගම්වල කියාතිබෙන "නිසා, පිනිස" යන වචන දෙක විභක්තිවචනවල්ය.

නුමුත්, මම සිටිය නිසා ඔහු ගියාය—මේක හොඳ නිසා (හොඳව තිබෙන නිසා) ඔහු ගතතාය—රක්‍ෂාවක් ලබාගන්න පිනිස ඔහු වැඩකලාය කියනවානම් "නිසා, පිනිස" යන දෙකෙන් ක්‍රියාවචනයක් නාමවචනයකට නොහොත් නාමවෙනු වචනයකට නොව තවත් ක්‍රියාවචනයකට සන්ධිවෙන බැවින් "නිසා, පිනිස" යන දෙක විභක්තිවචන වෙනෙක් නැත.

---

## සන්ධිවචන ගැනය.

I. සන්ධිවචනනම්:—ඉහල කියාතිබෙන විභක්තිවචන වෙන්නේ නැතුව වචනත් වාසගමුත් සන්ධිකරන පිනිස නොහොත් ඒවා එකිනෙකට සම්බන්ධවී තිබෙනබවත් සම්බන්ධවී තිබෙන අන්දමත් පෙන්වන පිනිස පාවිච්චිකරන වචනවල්ය.

වචන පමනක්නොව සුළු කීමුත් ඒ පිනිස පාවිච්චිකරනවාය.

II. වෙන වෙන වාසගම් නොහොත් එක වාසගමේ වෙන වෙන කොඨාස සන්ධිවචනවලින් සම්බන්ධවෙනනුමුත් සමහරවිට අභිප්‍රාව විරුඬව තිබෙනවාය.

1 අභිප්‍රාව එකඟබව පෙන්වන ඒවාය.
සහ, ත, ද, තවද, නිසා, බැවින්, පිනිස, කියා, බව, නම්, අතර, තුරු

2 අභිප්‍රාව විරුඬබව පෙන්වන ඒවාය.
වත්, නොහොත්, එක්කෝ, නුමුත්, එහෙත්.

3 ආදිසවල්ය:—මම සහ ඔහුත් ගියා—අශ්වයන්ද ඌරන්ද ගේනන වත් මරන්වත් යෙදුනා
ඔහු ලෙඩින් ඉනන නිසා (බැවින්) මම ආවා.

Digitized by Google

ඔහු ගිය බව මම දන්නවා—ඔහු ගියාය කියා මම සිතුවා.
ඔහු එනතුරු මම යන්නෙ නෑ—එසේනම් මක්වේද?
ඇරත් ඔහු වැඩකරන අතර මම ලියනවා.
කොහොමවුණුවුත් අපි යන්ට ඕනෑ—ඔහු යනවා වාගේ පේනවා
මමවත් ඔහුවත් සිටියේ නෑ—වුණුවුත් අපි ගියා.
ඔවුන් කරනවුණුවුත් අපි කරන්නෙ නෑ.

4 සන්ධිවචනනම්—වෙනස්වූ කාරනා සන්ධිකරන වචන බව ඉහල ආදිසවලින් පෙනෙන්ට තිබෙනවාය.

මෙසේ, 1 වෙනි ආදිසයෙන් හැඟෙන්නෙ මම ගියාය ඔහු ගියාය යන ඒවාය. 3 වෙනි ආදිසයෙන් හැඟෙන්නෙ ඔහු ලෙඩින් ඉන්නබවත් මම ඇබවත් එයින් පලමුවෙනි එක දෙවෙනි එකට හේතුවක්ව තිබෙන බවත්ය. 7 වෙනි ආදිසයේ "එසේනම්" යන එකෙන්, වාසගමේ කියා නැතතාවූ, ඉස්සර කිව්වාවූ කාරනාවකට වාසගම සන්ධිවී තිබෙනබව පෙනෙනවාය.

III. සමහර වචන ක්‍රියාළපකාරවචනද නොහොත් විභක්ති වචනද නොහොත් සන්ධිවචනද කියා දැනගන්ට සමහර විට ගෝලයාට අමාරුවෙන්ට පුළුවන් බැවින් මෙයාකාර කල්පනාකර බලන්ට ඕනෑය.

1 විභක්ති වචනනම්— ක්‍රියාවචනයේ බලය නාමවචනයට පැමිනෙන අන්දම නොහොත් ක්‍රියාව නාමවචනයට සම්බන්ධවෙන අන්දම පෙන්වන වචනවල්ය.

මෙසේ, ඔහු මා එනවාය කියනවානම් මා අතරෙත් එනවා යන එක අතරෙත් යම් සම්බන්ධයක් තිබෙනබව පෙනෙන්නෙ නැත. ඒ සම්බන්ධය පෙන්වනපිනිස—වෙතට, වෙතින්, උඩින්, නිසා—යනාදී යම් වචනයක් ඕනෑකරනවාය. ඒක අත්අරින්ටමබැරිය.

2 ක්‍රියාළපකාරවචන නම් — නාමවචනවල ගුන ඇර වෙන වචනවල ගුන පෙන්වනනාවූ වචනවල්ය. ඒවා සපදන් විභක්තියේ තිබෙන නාමවචනයකට අයිති නැත්නම් වාසගම වියවුල්වෙන්නෙ නැතුව ඒවා වාසගමෙන් අත්අරින්ට පුළුවන.

මෙසේ, ඔහු ඉතා ඉක්මනින් ආවා නොහොත් ඔහු ඉක්මනින් ආවා නොහොත් ඔහු ආවා යන තුනම කියන්ට පුළුවන. මේක ඉතා හොඳ පොතක්ය නොහොත් මේක හොඳ පොතක්ය.

3 සන්ධිවචනනම්— ක්‍රියාවේ බලය නාමවචනයට පැමිනෙන අන්දමවත් යම් වචනයක ගුනවත් තරමවත් පෙන්වන පිනිස නොව වෙන වෙන වාසගම් වෙන්ට පුළුවන්වූ කාරනා සන්ධිකරන පිනිස පමනක් පාවිච්චිකරනවාය.

Digitized by Google

4 වාසගමේ අන්‍දමේ ප්‍රකාරයට සමහර වචන වෙන වෙන වර්ගවලට අයිතිවෙන හැටි මෙහි පහත ආදර්ශවලින් දැනගන්ට පුළුවන.

| | ක්‍රියාඋපකාර වචනවල්ය. | විභක්ති වචනවල්ය. | සන්ධි වචනවල්ය. | ගුනවචනවල්ය. |
|---|---|---|---|---|
| පසෙස් | මම පස්සෙ ආවා | ඔහු මා පස්සෙ ආවා | | |
| ළඟ | ළඟ තිබෙන ගෙයකට පලයන් | මා ළඟ තිබෙන දේ | | |
| ළඟදී | ළඟදී ඒවියි | | ඔහු ආ ළඟදී මම ගියා | |
| උඩ | උඩ තිබෙන තාරුකා | ඒක මා උඩ තිබෙනවා | | උඩ කොඨාසය |
| යට | යට තිබෙන දේ | ඒක මා යට තිබෙනවා | | යට කොඨාසය |
| ඉදිරිපිට | ඉදිරිපිට සිටින මනුෂ්‍යයා | මා ඉදිරිපිට සිටින මනුෂ්‍යයා | | |
| ඉස්සරහ | ඉස්සරහ තිබෙන දේ | මා ඉස්සරහ තිබෙන දේ; ඔහු මා ඉස්සරහට ආවා | | ඉස්සරහ පැත්ත |
| ඉස්සර | ඔහු මට ඉස්සර ආවා; මගේ ඊමට ඉස්සර ඔහු ආවා | | මම එතනට ඉස්සර ඔහු ආවා | |
| පිනිස | | රක්ෂාවක් පිනිස වැඩකරපන් | රක්ෂාවක් ලබාගන්න පිනිස වැඩකරපන් | |
| නිසා | | ඔහු මා නිසා ගියා | මම ඉන්න නිසා උඩ පලයන් | |
| මෙයාකාර | මෙයාකාර කරනවා | | | මෙයාකාර දේ |

Digitized by Google

### විස්මවචන ගැනය.

1 විස්මවචන කියනෙත් විස්මපත්කමටත් වේදනාවටත් කනගාටුවටත් ප්‍රීතියටත් ඉබේම වාගේ කියවෙන වචන වලටය.

2 ඒවා වාසගමේ වෙන යම් වචනයකට සම්බන්ධවෙන්නේ නැත.

3 ඒවානම්:—

අප්පොච්චියේ, අඃ, අනේ, අයියෝ, අහෝ, උඃ, අපොයි, ඉස්, ච්, හාහා, ඔහෝ, යන ඒවාය.

---

## නැන්වෙනි කොට්ඨාසය.

### වාසගම් ගැනය.

වාසගමය කියනෙත් අභිප්‍රායක් පෙනෙන හැටියට වචන නිසි පිළිවෙලට තිමටය.

I. එක එක වාසගමෙන් එක කාරනාවක්වත් සම්පූර්ණ ලෙස දන්වනවාය.

මෙසේ, මම පොත යන එක කියනවානම් ඒක වාසගමක් නොවේය මම පොත දෙනවාය කියනවානම් ඒක සම්පූර්ණ වාසගමක් වෙනවාය. නුමුත් කථාවේදී සියළු වාසගම් සම්පූර්ණකරන්ට ඕනෑ නැත.

මෙසේ, උඹට පේනවාද කියා ඇසුවාම, පේනවා යන වචනයෙන් පමනක් උත්තරදෙන්ට පුළුවන. එක කාරනාවක් පමනක් අඩංගු වෙනනාවූ, ක්‍රියාවචනය ප්‍රකාස අන්දමෙන් කියනනාවූ වාසගමට අමිශ්‍රවූ වාසගමය කියනවාය.

ආදිස :—මම යනවා, යහපත් මනුෂ්‍යයා යහපත් දේවල් කරනවා ඇත, මේක හොඳයි.

II. එකඑක වාසගමේ නොයෙක් කොඨාස තිබෙන්ට පුළුවන. එයින් එක එක කොඨාසයට වෙන වෙන ක්‍රියාවචන තිබෙන්ට ඕනෑය.

ආදිස:—1 උඹ යනවානම් 2 මම යනෙත් නැත. 1 ඔහු දේසනාකරමින් 2 යහපත්කම්කරමින් 3 තැනින් තැන ඇව්ද්දය. 1 මම ගියත් 2 එයින් ප්‍රයෝජන නැතිබැවින් 3 ඒ කාරනාව ඉෂ්ටකරන්ට 4 උඹ යන්ට ඕනෑය. 1 මම කරනෙත් 2 මේකයි. 1 මම වැඩ කරනෙත් 2 වැඩෙන් මුදල් ලැබෙන නිසයි, 1 ඔහුව බලන පිනිස 2 මම යනවා. 1 මා බලන්ට 2 ඔහු ආවොත් 3 උඹ පලයන්.

එක කාරනාවකට ත් එක ක්‍රියාවචනයකටත් වඩා කාරනාවල්ද ක්‍රියාවචනද අඩංගුව තිබෙනනාවූ නොහොත්



Digitized by Google

විසත්‍ර අන්දමෙන් කියනනාවූ වාක්‍යගමට මිස්‍රවූ වාක්‍යගමය කියනවාය.

සමහරවිට වාක්‍යගමේ ක්‍රියාවචනයක් නැති නුමුත් තිබෙනවා වාගේ හැගෙනවාය.

ආදිස:—මේක හොඳයි (හොඳව තිබෙනවා). හොඳය කියා (හොඳව තිබෙනවාය කියා) ඔහු කිව්වා.

III. සත්‍ය විධියේ ක්‍රියාවචනයකින් එක එක වාක්‍යගමේ යම් කාරනාවක් අමුතුවෙන් කියන බව ඉහල ආදිසවලින් පෙනෙනවාය.

මෙසේ, මුදල් ලැබෙන නිසා මම වැඩකරනවාය යන වාක්‍යගමේ අමුතුවෙන් කියනෙත් වැඩකරනවාය යන එකය. එමෙන්ම, මම වැඩකරන නිසා මට මුදල් ලැබෙනවාය යන වාක්‍යගමේ අමුතුවෙන් කියනෙත් මුදල් ලැබෙනවාය යන එකය.

අමුතුවෙන් කියන කාරනාව අඩංගු කොණ්ඩසයට වාක්‍යගමේ ප්‍රධාන කොණ්ඩසයය කියනවාය. අනිත් කොණ්ඩසවලට යටත් කොණ්ඩසවල්ය කියනවාය.

වාක්‍යගමේ හැටියට අමුතු කාරනාව ඇති කොණ්ඩසයට ප්‍රධාන කොණ්ඩසයය කියන නුමුත් ඒකේ කාරනාවට වඩා වැදගත් කාරනා වාක්‍යගමේ කියාතිබෙනවා වෙනතට පුළුවන.

IV. අමිස්‍රවූ වාක්‍යගමේ වචන පිහිටුවන අන්දම ගැනය.

1 ගුන දෙනනාවූ සියළු වචන එයින් ගුනලැබෙන වචනවලට මුලින් පැමිනෙනවාය.

ආදිස:—යහපත්වූ මනුෂ්‍යයා ඉතා ඉක්මනට ආවා. නපුරුවූ මනුෂ්‍යයා මේ නරක දේවල් කලා.

2 සම්බන්ධවිභක්තියේ වචනයත් ඊට අයිති නාමවචනයට මුලින් පැමිනෙනවාය.

ආදිස:—මගේ පියා, මේ පොත්වල කොල.

3 අමිස්‍රවූ වාක්‍යගමේ නාමවචනත් ක්‍රියාවචනයත් පිහිටුවන විධිය මෙහි පහත ආදිසවලින් පෙනෙනවා ඇත.

මම ඔහුට අශ්වයන් දුනතා, ඔහු මගෙන් අශ්වයන් ගතතා.

මෙසේ, 1කොට කතෘවිභක්තියේ වචනයද, 2වෙනුව සපදන් නොහොත් අවදිවිභක්තියේ වචනයද, 3වෙනුව කර්මවිභක්තියේ වචනයද, අන්තිමකොට ක්‍රියාවචනයද පැමිනෙන බව පෙනෙනවාය.

ඉහල අන්දම නියම අන්දම නුමුත් එනි කියාතිබෙන නාම වචන නොයෙක් අදහස් පිනිස මාරුකරන්ට පුළුවන.

ආදිස:—අශ්වයන් (නම්) මම ඔහුට දුනතා. ඔහුට (නම්) මම අශ්වයන් දුනතා. මම අශ්වයන් (නම්) ඔහුට දුනතා.

Digitized by Google

ක්‍රියාවචනය ප්‍රකාශ අන්දමෙන් කියද්දී ඒ වාක්‍යගමට අයිතිවූ යම් වචනයක් ඊට අගින් කියන්ට සුදුසුය.

මෙසේ—මම ඔහුට දුනනා අශ්වයන්, මම අශ්වයන් දුනනා ඔහුට, ඔහුට අශ්වයන් දුනනා මම, මම ඉක්මනට ගියා ඒ ස්ථානයට යන වැරදි අන්දම්වලින් නොයෙක් දෙනෙක් කථාකරනවාය. කථා වේදී වාක්‍යගමේ හරි ස්ථානයට කියන්ට බැරිවුන වචනයක් සම හරවිට පසුව කියන්ට පුළුවන් වුනුත් ඒ අන්දමට පුරුදුනොවෙන හැටියට බලාගන්ට යුතුය.

ක්‍රියාවචනය විස්තරඅන්දමෙන් කියනවානම් අමිශ්‍ර වාක්‍යගම එයින් මිශ්‍රවාක්‍යගමක් වෙනවාය.

ආදිශ:—මම කරන්නේ මේකයි (එනම් මම කරන එක මේකව තිබෙනවා). මේක කරන්නේ මමයි (කරනනා මමව සිටිනවා).

සිංහල භාෂාවේ ක්‍රියාවචනය විස්තරඅන්දමෙන් සුදුසු ලෙස පාවිච්චිකෙරීමෙන් වාක්‍යගම කොපමන බලවත් වෙන්ටත් අලංකාරවෙන්ටත් යෙදෙනවා නොවේද!

ආදිශ:—මම ඔහුට දුනෙන් අශ්වයනුයි. මම අශ්වයන් දුනෙන් ඔහු ටයි. ඔහුට අශ්වයන් දුනෙන් මමයි.

V. නාමවචනවලට නිසි විභක්ති පාවිච්චිකෙරීම ගැනය.

1 විභක්තිවචන සමග පාවිච්චිකරන නාමවචන කම්විභක්තියෙන් කියන හැටියට බලාගන්ට ඕනෑය.

එසේ බලාගන්ට ඕනෑකරන්නේ කම්විභක්තියේ අන්දම කතෘවිභක්තියේ අන්දමට වෙනස්ව තිබෙන වචන ගැන පමනය.

මෙසේ, උඹ, උඹලා, ඔහු, ඔවුන්, අශ්වයා, ඌරා, පොත, පොත්, යනාදි බොහෝ වචනවල කම්විභක්තියත් කතෘවිභක්තියත් සැබිදයෙනුත් පෙනීමෙනුත් එකාකාරව තිබෙනනුමුත් මම, අපි, යන වචන දෙකෙත් අශ්වයෝ, ඌරෝ, අලි, ගුරුවරු, යන වචන වාගේ බහුඅන්දමෙන් කියන වැඩිපගුව වචනවලත් කම විභක්තිය, මා, අප, අශ්වයන්, ඌරන්, අලින්, ගුරුවරුන් යන වෙනස්වූ අන්දමෙන් කියනවාය.

ඉන්නිසා, අපි විසින්, මම විසින්, අපි ලඟ, මම එක්ක, මම් එක්ක, මන් එක්ක, මනුෂ්‍යයෝ සමග, මනුෂ්‍යයෝ ලඟ, මනුෂ්‍යයෝ විසින්, යනාදී අන්දම් පාවිච්චිකෙරීම ඉතා මත්ම වැරදිය.

2 සන්ධිවචනවලින්වත් සපදන්විභක්තියට අගින් නොපැමිණෙන ක්‍රියාඋපකාරවචනවලින්වත් නාමවචනයට කිසි වෙනසක් අටනොගනනා බව හිතාටගන්ට යුතුය. එබැවින් යම් වචනයක් ඒ දෙජාතියෙන් එකකට අයිතිද නොහොත් විභක්තිවචනයක්ව තිබෙනවාද කියා හොඳ ආකාරයෙන් කල්පනාකරන්ට ඕනෑය.

මෙහි පහත ආදර්ශවලින් ඒ වෙනස්කම් දැනගන්ට පුළුවන.

**නිසා**
- කථාකරනනාවූ මා නිසා (උදෙසා) පලයන් (විභක්ති:)
- කථාකරන්නේ මම නිසා (බැවින්) පලයන් (සන්ධි:)
- ඔහු කථාකරන්නේ මට නිසා මම යනවා (සන්ධි:)
- පොත ගත්තේ මගෙන් නිසා ඒක තියාගනින් (සන්ධි:)
- (එනම් පොත මගෙන් ගත් නිසා ඒක තියාගනින්)

**ලඟදී**
- ඒ මනුෂ්‍යයෝ ලඟදී වැඩකරනවා ඇති (ක්‍රියාඋපකාර)
- ඔහු ඒ මනුෂ්‍යයන් ලඟදී වැඩකරනවා ඇති (විභක්ති)

**වාගේ මෙන්**
- අශ්වයෝ වාගේ මනුෂ්‍යයොත් දුවනවා (සන්ධි)
- හුඹුත් අශ්වයන් වාගේ (මෙන්) මනුෂ්‍යයෝ දුවනෙනාත් නැත (විභක්ති)
- අපට මෙන් ඔවුන්ටත් පොත් ලැබුනා (සන්ධි:)
- අපි අශ්වයන් මෙන් දිව්වා (විභක්ති:)
- මගෙන් වාගේ ඔහුගෙනුත් පොතක් ගනනා (සන්ධි:)
- අපි දේවදූතයෝ වාගේ යහපත්ලෙස හැසිරෙමු (සන්ධි:)
- (එනම් අපි දේවදූතයෝවා වාගේ—දේවදූතයෝව සිටිනවා වාගේ)
- දේවදූතයන් වාගේ (මෙන්) යහපත්ලෙස හැසිරෙමු) (විභක්ති:)

**බව**
- ඔහු ගැහුවේ මට බව උඹ දනනවා
- ඔහු ඒක ගත්තේ මිගෙන් බව උඹ දනනවා
- ඔහු අල්ලාගත්තේ මා බව උඹ අනනවා
- මෙහි ඉන්නේ මම බව උඹ දනනවා
- උඹේ සහෝදරයෝ අපි බව උඹ දනනවා

**කියා**
- ඔහු ගැහුවේ මටය කියා උඹ කිව්වා
- ඔහු අල්ලාගත්තේ මාය කියා උඹ කිව්වා
- උඹේ සහෝදරයෝ අපිය කියා උඹ කිව්වා

(බව, කියා: සන්ධි :)

එනම් ඔහු මට ගැහු බව උඹ දනනවා, ඔහු මට ගැහුවාය කියා උඹ කිව්වා. මම මෙහි ඉනනා බව උඹ දනනවා, අපි උඹේ සහෝදරයෝය (සහෝදරයෝව සිටිනවාය) කියා උඹ කිව්වා යනාදී.

3 කතෘකාරයාගේ ක්‍රියාව ලැබෙන නාමවචනය කර්මවිභක්තියෙන් කියන්ට සුදුසුව තිබෙන නොයෙක් ප්‍රස්ථාවලදී බොහෝ අයවල් ඒක කතෘවිභක්තියෙන් කියනවාය.

මෙසේ, අපි ඌරන් විකුනනවා, මම අශ්වයන් ගෙනාවා යනාදී වෙනුවට අපි ඌරෝ විකුනනවා, මම අශ්වයෝ ගෙනාවා යනාදී වැරදිලෙස කියනවාය.

VI. මිශ්‍රවූ වාක්‍යගමේ නොයෙක් කොටස් පිහිටුවන ක්‍රමය මෙසේය.

Digitized by Google

UNIV. OF CALIFORNIA

. ප්‍රධාන කොටසෙහි ක්‍රියාවචනය විධ්‍යර්ථයෙන් තියනවානම් ඒක සහ ඊට අයිති වචන සියල්ලත් වාක්‍යයේ මුලට තියන්ට ඕනෑය.

ආදිස:—මම දවස්පතාම මේ දේවල් කරන්නේ රක්ෂාවක් ලබාගන්න පිණිසයි.

2 ප්‍රධාන කොටසෙහි ක්‍රියාවචනය ප්‍රකාශාර්ථයෙන් තියනවානම් ඒක වාක්‍යයේ අගට පැමිණෙනවාය. ඊට අයිතිවූ අනික් වචන වෙන කර්තෘකාරයෙක් වාක්‍යයේ නැත්නම් වාක්‍යයේ මුලට පැමිණෙන්ට පුළුවන. නුමුත් වාක්‍යය දිගනම් අන්තිම ක්‍රියාවචනයට අයිති වචන ඒක එක්ක වාක්‍යයේ අගට තීම වඩා හොඳය.

ආදිස:—මම මේ දේවල් රක්ෂාවක් ලබාගන්න පිණිස කරනවා, නොහොත් රක්ෂාවක් ලබාගන්න පිණිස මම මේ දේවල් කරනවා — ඔහු පොතක් මිලේට ගන්න පිණිස මම ඔහුට මුදල් දුනා.

3 වාක්‍යයේ යටත් කොටස අතරෙන් මුල් හේතුව නොහොත් අදහස අඩගු කොටසය මුලට පැමිණෙනවාය ඊලඟට එයින් අටගන්න කාරනාව යනාදී ක්‍රමයෙන් කොටසයකට අගින් කොටසයක් පිහිටුවාගන යනවාය.

ආදිස:—1මම මගේ මිත්‍රයන්ට ආදරේනිසා 2ඔවුන්ට යහපත්කම් කෙරීම සඳහා 3මගේ හොඳ නාමය ආරක්ෂාකරගන්න හැටියට 4මගේ නය ගෙවීමට 5මුදල් ලබාගන්න පිණිස 6මම වැඩකරනවා.

4 ක්‍රියාවචනය ගුන අර්ථයෙන් තියනවානම් එයින් ගුන ලැබෙනනාවූ නාමවචනය ඊට අගින් පැමිණෙනවාය.

(a) ගුනලැබෙනනාවූ නාමවචනය ඊට මුලින් පැමිණෙන ක්‍රියාවචනයේ කර්තෘකාරයා වෙනනට පුළුවන නොහොත් ක්‍රියාව ලබනනා වෙනනට පුළුවන.

ආදිස:—සතෙක් මරනනාවූ මම — මම මරනනාවූ සතෙක් මනුෂ්‍යයෙක් ගැන කිව්වාවූ මම — මම කිව්වාවූ මනුෂ්‍යයෙක්.

(b) ගුනලැබෙනනාවූ වචනයට අගින් පැමිණෙන වචනවලින් ඊට වෙනස්කම් අටගන්නවා මිස ඊට මුලින් තිබෙන යම් වචනයකින් කිසි වෙනසක් අටගන්නේ නැත.

ආදිස:—(මම (කර්තෘ) අශ්වයන් (කර්ම) ගෙනාවා
මම ගෙනාවාවූ අශ්වයෝ ඉන්නවා

Digitized by Google

මම ගෙනාවාවූ අශ්වයන්ට කෑම දීපන්
අශ්වයන් ගෙනාවාවූ මට ඔහු ගැහුවා
අශ්වයන් ගෙනාවාවූ මගෙන් ඔහු පොතක් ගත්තා

## 5 වාක්‍යගමේ යටත් කොඨාශ නාමවචනයකට ගුනකීම් කොට පාවිච්චිකරනනට පුළුවන.

ආදිස:—මගේ මිත්‍රයින්ට් ආදරේ නිසා ඔවුන්ට යහපත්කම්කෙරීම සඳහා මගේ හොඳ නාමය ආරක්‍ෂාකරගන්න හැටියට මගේ නය ගෙවීමට මුදල් ලබාගන්න පිනිස. වැඩකරන්නාවූ මම මෙහි සිටිනවා.

ඉහල වාක්‍යගමේ මම යන වචනයට මුලින් කියාතිබෙන සියළු කීම් ගුනකීම් නොහොත් ඒ මුළු කොඨාශය මම යන වචනයට ගුනදෙන කොඨාශයක් බව පෙනෙන්ට තිබෙනවාය.

## එයින් එක එක කොඨාශය ගුනවචනාවලින්නුත් ගුනකීම් වලින්නුත් බොහෝසෙයින්ම දික්කරන්ට පුළුවන.

ආදිස:—සෑමදෙනා ඉදිරියේ සියළු ස්ථානවලදීම ඉතා යහපත්ලෙස හැසිරෙනනාවූ මගේ ඉතා යහපත් මහළු මිත්‍රයින්ට මම බොහෝසෙයින්ම ආදරේ නිසා මට පුළුවන් සෑම අන්දම් වලින්ම ඔවුන්ට යහපත්කම්කෙරීම සඳහා සියළු වස්තු වලට වඩා අගේව තිබෙන මාගේ හොඳ නාමය නිර්දෝෂව ආරක්‍ෂාකරගන්න හැටියට ප්‍රමාද නැතුව මගේ නය ගෙවීමට සෑහෙනපමන මුදල් සුදුසු අන්දම්වලින් ලබාගන්න පිනිස රෑදවල් දෙකේම ඉතා කඩිසරලෙස නොකඩවම වැඩකරනනාවූ මම සැපසනීපයෙන්නුත් සමාදානයෙන්නුත් සිටිනවාය.

---

ත්‍රීකුවය.



